
# දළදා වරුණ

ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2558 වෙසක් මස බුද දින

■ 2014 මැයි මස 14 වැනි බදාදා





# බුද්ධ පූජාව තැබීම සම්බන්ධයෙන් දැනුවත් වෙමු

**දික්වෙල යෝගියාන ශ්‍රී විසුද්ධාරාමාධිකාරී සහ කිරිබත්ගොඩ ශ්‍රී ධීරානන්ද විද්‍යායතන පිරිවෙනෙහි ආචාර්ය පූජ්‍ය කොටියාගල සීවලී හිමියෝ අවධාරණය කරති.**

● අප බුද්ධ පූජාව තබන්නේ ඇයි?

පූජ්‍ය තාලන්දවේ විමලවංශ හිමි




# පිරිතේ ගුණ ලබන්නට නම්...!


පිරිතෙන් හොඳින්ම ගුණ ලැබෙන්නට නම් නොවරදවා හොඳින් පාඩම් කරගෙන පිරිත්වල අර්ථ (අදහස්) ද දැනගෙන කිව යුතුය. දැනට පිරිත් කියන අය අතර ඒවායේ තේරුම් දැනගෙන කියන අය ගිහියන් අතර තබා පැවිද්දන් අතරද ඉතා හිඟය. තේරුමක් නැතිව කියන පිරිතේත් බලය අඩුය. එහෙත් ගුණයක් නොලැබෙන්නේද නොවේ. පිරිත නොවරදවා පාඩම් කරගෙන හරියට කියතහොත් එයින්ද තරමකට ගුණ ලැබේ. එසේ ගුණ ලැබෙන්නේ වචනවල හෙවත් ශබ්දවල යම්කිසි බලයක් ඇති නිසාය. වචනවල ඇති බලය එතරම් මහත් එකක් නොව සුළු බලයකි. වාර බොහෝ ගණනක් පිරිත් හඬෙහි බිය ගන්වන බලය, බිය දුරු කරන බලය, වශීකරන බලය හෙවත් අන්‍යයන්ගේ සිත් සතුටු කරන සිත් ගන්නා බලය, ශරීරයේ වා පිත් සෙම් යන තුන්දෙස් සමනය කිරීමේ බලය, ශරීරයේ සප්ත ධාතූන් වර්ධනය කිරීමේ බලය, නොයෙක් වේදනා, නොයෙක් රෝග දුරු කිරීමේ බලය, සැප සම්පත් ලබාදීමේ බලය, අමනුෂ්‍යයන්ගෙන්, සොරුන්ගෙන්, සතුරන්ගෙන්, සර්පයන්ගෙන් ආරක්ෂා කිරීමේ බලය ග්‍රහ අපල ඇස්වහ කටවහ ආදී දෝෂ දුරු වීමේ බලය යනාදී නොයෙක් බල ඇත්තේය.

මන්ත්‍රවලට ගෙන ඇති වචනවල හොඳ නරක දෙකම සිදුකිරීමේ බල ඇත්තේය. රෝග සුව කිරීමේ බල, රෝග ඇති කිරීමේ බල, සිත් සන්සුන් කිරීමේ බල, සිත් වික්ෂිප්ත කොට උමතු කිරීමේ බල, අමනුෂ්‍යයන් දුරු කිරීමේ බල, ඉන්නා තැනින් පන්නා දැමීමේ බල, අන්‍යයන්ගේ සිත් ඇද ගන්නා බල යනාදී අනේක ප්‍රකාර බල මන්ත්‍රවල කවිවල ඇත්තේය.

පිරිත් අතුරෙන් කරණීය මෙත්ත සූත්‍රය බොහෙවින් වශීකරණ බලය ඇති සූත්‍රයකි.

අන් සැම පිරිත් සූත්‍රයකට වඩා ලස්සනට, මිහිරියට කිය හැකි සූත්‍රය කරණීය මෙත්ත සූත්‍රයය. එහි වඩාත් වශීකරණ බලය ඇත්තේ ඒ නිසාය. දීඝ අකුරු, කෙටි අකුරු, අල්ප අකුරු, මහාප්‍රාණ අකුරු වරදවන්නේ නැතිව, වචන මැදින් බිඳින්නේ නැතිව එක් වචනයක් අග හෝ මුල අකුරක් අන් වචනයකට එකතු නොකර ව්‍යන්ජනය නොබිඳ නියම තාලයට මිස මන්ත්‍ර කියන තාලයට වේගයෙන් නොකිය යුතුය. මේ ගාථා, ගාථා තාලයට මිස මන්ත්‍ර කියන තාලයට වේගයෙන් නොකිය යුතුය. එසේ නියම තාලයට නොවරදවා මේ සූත්‍රය කියතහොත් එහි අර්ථ නොතේරෙතත් ගුණ ලැබෙනු ඇත. සමහරවිට වරදවා කියන පිරිත්වලින්, මන්ත්‍රවලින් දෙස් ඇති වන්නටද බැරි නැත. තේරුම් නොදැන වුවද පිරිත කියත හොත් ශබ්දයෙන් ලැබෙන ගුණය ලැබෙන්නේය.





පූජ්‍ය යටිමලගල
සුමනසාර හිමි

"යමකු බැරෑරුම්කමින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පවට ආශා නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."






# දන් වැළඳීමේදී සිතට ගත යුතු සික්ඛා පද නොහොත් විනය රීති

තමා වළඳන්නා වූත් නොවළඳන්නා වූත් සෑම දෙයම බෙදන තරමින් බෙදීමට ඉඩ නොදිය යුතුය.

පාත්‍රයට යොමු කළ සිත් ඇතිව ආහාර පිළිගත යුතුය.

ආහාර බෙදද්දී නොසැලකිල්ලෙන් වටපිට බැලීම නොකළ යුතුය.

පාත්‍රයේ හැටියට සව මට්ටමට ආහාර පිළිගත යුතුය.

බතට සෑහෙන පමණට ව්‍යඤ්ජන පිළිගත යුතුය.

සිහියෙන් හා සැලකිල්ලෙන් ආහාර වැළඳිය යුතුය.

පාත්‍රයට යොමු කළ සිත ඇතිව ආහාර වැළඳිය යුතුය.

ආහාර ඕඳුගෙහි තැනින් තැන නොවළඳා පිළිවෙලින් කොනක සිට වැළඳීම ආරම්භ කළ යුතුය.

බඳුනෙහි මුදුනෙන් ආහාරපාන වැළඳීමද නොකළ යුතුය.

ව්‍යඤ්ජන ආදිය වැඩියෙන් ලබාගන්නා අටියෙන් බෙදූ ඒවා බතින් නොවැසිය යුතුය.

ගිලනෙකු නොවේ නම් පිට අයගෙන් බත් හෝ ව්‍යඤ්ජන ඉල්ලීමද නොකළ යුතුය.

අවමන් කරන අදහසින් අනුන්ගේ පාත්‍රය දෙස නොබැලිය යුතුය.
(අඩුවක් ඇතිනම් දීම හෝ දෙවීම පිණිස බැලීම වරදක් නොවේ.)

බත්පිඩු මහත් කොට සාද නොවැළඳිය යුතුය.

බත්පිඩු මුව ළඟට ගන්නට කලින් කට ඇරීම නොකළ යුතුය.

වළඳනා කල සම්පූර්ණ අතම කට තුළට නොදැමිය යුතුය.

ආහාර කටට විසි නොකළ යුතුය.

මුව තුළ ආහාර තබාගෙන කතා නොකළ යුතුය.

බත් පිඩු කටින් කඩාගෙන කෑමද නොකළ යුතුය.

වඳුරන් මෙන් ආහාර කක්කේ තබාගෙන නොවැළඳිය යුතුය.

වළඳද්දී අත ගසා දැමීමෙන් බත් ඇට විසුරු වීමෙන් වැළකිය යුතුය.

දිව එළියට දමා වැළඳීම නොකළ යුතුය.

තළු ගසා ආහාර නොවැළඳිය යුතුය.

සුරු සුරු හඬ නංවමින් ආහාර නොවැළඳිය යුතුය.

වළඳද්දී අත ලෙව කෑම නොකළ යුතුය.

ඇඟිලිවලින් පාත්‍රය සූරා වැළඳීම නොකළ යුතුය.

වළඳද්දී තොල් ලෙව කෑමද නොකළ යුතුය.

ඉඳුල් තැවරුණු අතින් පැන් බඳුන් ආදිය නොඇල්ලිය යුතුය.

පාත්‍රය සේදූ වතුරට බත් නොදැමිය යුතුය.

ඉඳුල් වතුර, බත් ඇට, කටු, ලෙලි ආදිය වළඳන තැන දැමීමෙන් අපිරිසිදු නොකළ යුතුය.

වළඳන තැන කෑරීම,
සොටු සිරීම නොකළ යුතුය.

භාජනවල හැඳි ගැටෙන ශබ්ද ඇති කරමින් ආහාර ගැනීම නොකළ යුතුය.

පමණ දැන ආහාර වැළඳිය යුතුය.



"පව් කරන්නා මෙලොවින් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි. තම තමාගේ කිලිටි කර්මය දැක ශෝක කරයි. වෙහෙසෙයි පෙළෙයි."



# ශ්‍රී ලංකාවේ පළමු වෙසක් උත්සවය පැවැත්වූයේ **දුටුගැමුණු රජතුමාද?**



වෙසක් උළෙල බෞද්ධයන්ට ඉතා වැදගත්ය. බෝසතුන්ගේ උපත, බුදු බවට පත්වීම හා බුදුපිරිනිවන් සිද්ධවූයේ වෙසක් පසළොස්වකදය. ඒ හැර ලංකාවේදී වෙසක් ද සිදුවූ සිද්ධි ගණනාවකි. විජය ඇතුළු මුල්ම ආර්යන් ලංකාව ජනාවාස කිරීම, ලංකාවේ රාජ්‍යාභිෂේක ක්‍රමය ඇතිවීම, රුවන්වැලිසෑයට මුල්ගල තැබීම ඉන් කීපයකි. දඹදිව අශෝක රජු යටතේ පැතිරී තිබූ දියුණු මෞර්ය ශිෂ්ටාචාරය පෑතිස් රජු කල (ක්‍රි.පූ. 250-210) ලංකාවට ගෙන ඒම නිසා ලංකාවේ ආගමික මෙන්ම සංස්කෘතික පෙරළියක්ද ශ්‍රී ලංකාවේ ඇතිවිය.

බුදුදහම සමගම පෑතිස් රජු කල මිහිඳු හිමි ඒ වනතුරු දඹදිව තිබී වැඩී දියුණුව තිබූ වෙසක් උළෙලට ලංකාවට ගෙනා බවට සැකයක් නැත. වෙසක් උළෙලේ මූලාරම්භය දඹදිව අශෝක රජු කල ඇතිවූ බව සිතීම සාධාරණය. අශෝක රජුගේ පසුවැනි ගිරි ලිපියේ එන පරිදි රජු රටවැසියන්ට ඇතුන් විමාන, දිව්‍ය රූප ප්‍රදර්ශනය කළ බව කියයි. පසු කල දඹදිව සංචාරය කළ පාහියන් හිමියන්ගේ විස්තරය අනුව පාහියන් හිමි කොටාං (Kotan) නුවරදී අවුරුද්දේ දෙවැනි මාසයේදී හෙවත් මැයි මාසයේදී පිළිම පෙරහරක් දුටු බව වාර්තා කරයි. දඹදිව මුල් කල ඇරඹී දිගට පැවති වෙසක් පෙරහරක් පසු කල දඹදිවට ආ පාහියන් හිමි දුටු බව පෙනෙයි.

මහාවංශය ඇතුළු වංශකතාවල බුදුදහම පැමිණි කලත් යනතුරු වෙසක් උත්සවයක්, වෙසක් උළෙලක් ගැන සටහනක් නැත. ඊට හේතුව එකල වෙසක් උළෙල ලංකාවේ නොපැවැත්වීමට හෝ වංශකතාකරුවන් පසු කල වංශ කතා ලියන විට තොරතුරු ගිලිහී යාමද විය හැක. එමෙන්ම ථෙරවාදී ක්‍රමය අනුව බාහිර පුද පූජා අවැදගත් කොට සැලකීමද තවත් හේතුවකි.

ලංකාවේ වංශකතාවක පළමු වරට වෙසක් උළෙල ලංකාවේ පැවැත්වූ බව කියනුයේ දුටුගැමුණු රජුය. (ක්‍රිස්තු පූර්ව 161-157) ඒ බුදුදහම පැමිණ අවුරුදු සියකට වඩා පසු කලකය. මහාවංශයේ 32 පරිච්ඡේදයේ 35 ගාථාව දුටුගැමුණු රජු වෙසක් පූජා විසිහතරක් කළ බව පළමු වරට වාර්තා කරයි. මේ වැදගත් සිද්ධිය සමන්ත පාසාදිකාවේ නොවෙයි. මහා වංශයට පෙර ලියවුණු දීපවංශයේද නොකියවෙයි. දුටුගැමුණු අවුරුද්දකට එක බැගින් මේ වෙසක් පූජා විද කළ බව පෙනී යයි.

**එස්. කේ. ජයවර්ධන**

# සසර දුකට මූලික හේතුව ඔබ හරිහැටි දැන සිටියාද?

සකල ජනමන සනසන අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සත්වයන්ගේ ජාති, ජරා, ව්‍යාධි, මරණාදී අනේකවිධ දුක් වේදනාවන්ට හේතුවන්නේ අවිද්‍යාව බව ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කොට දේශනා කළ සේක.

මෙයට වසර දෙදහස් පන්සියකට පෙර දඹදිව බුද්ධගයාවේදී බුදු බව ලැබීමෙන් සිව්වන සතියේ දෙවියන් විසින් මවන ලද රුවන් ගෙය වැඩ හිඳ තමන් වහන්සේ විසින්ම අවබෝධ කරගත් පටිච්ච සමුප්පාද ධර්මය මෙනෙහි කළ සේක.

ලෝකය හා සත්වයා පිළිබඳව යථාර්ථ සංසිද්ධිය මැනවින් දනගත හැක්කේ පටිච්ච සමුප්පාදය නමැති හේතුඵල ධර්මය මාර්ගයෙනි. ලෝකය පවතිනවාය යන්නෙන් ප්‍රකට වන්නේ සම්මුති පරමාර්ථ හා සංකල්ප විකල්ප ක්‍රියාත්මක වීමය. පුහුදුන් මිනිසා පෞද්ගලිකව තෝරා බේරාගත් සංකල්ප සමූහයකට මැදිවී මරණය දක්වාම දේවවාදය, දෛවවාදය, ආත්මවාදය ආදී මිථ්‍යා මතවල ආධානග්‍රාහීව මුලාවී ක්‍රියා කොට එයට අනුරූපව මරණින් මතු දුගතිගාමී වන්නේය.


**"සච්චානං තථියං අවිදිතං කරෝතීති අවිජ්ජා දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛ නිරෝධෙ අඤ්ඤාණං දුක්ඛ නිරෝධ ගා මිනියා පටිපදය අඤ්ඤාණං අයං වුච්චති අවිජ්ජා."**


අවිද්‍යාව යන වචනයෙහි අදහස් ඇතත් ධර්මයෙහි ප්‍රධාන අදහස නම් චතුරාර්ය සත්‍ය ධර්මය යථාර්ථයෙන් නොදැනීමය. දුක්ඛ, සමුදය, නිරෝධ මාර්ග යන චතුරාර්ය සත්‍ය ධර්මය නොදැනීම නිවනට පැමිණීමට පමණක් නොව දෛනික කාර්යයන් නිර්මුල්ව, ක්‍රමවත්ව කරගෙන යාමටද බාධා වන්නේය.

අප සැප යයි සංකල්පයක් ගොඩ නගන්නේ කෙදිනක හෝ දුක් වේදනාවක් ඇතිවූ නිසාය. උපන් ද පටන් මොහොතක් පාසා ඇතිවන සා පිපාසා දුක නැති කිරීමට පිළියම් යෙදුවද මරණාසන්න චිත්තවීථිය දක්වා එය ගමන් කරන්නේය. එයම අනිත්‍ය බවත්, දුක්ඛ සත්‍ය බවත්, අවබෝධ නොවන්නේ ආත්මවාදය නිසාය.

දෛනික ජීවිතයේ අත්දැකීම් සමග අපේ ක්‍රියාකාරීත්වය වැඩි වශයෙන් ශෝක සන්තාප වන්නේ ආහාරය නිසාය. සෑම සත්වයාම මොහොතක් හෝ උපන් භවයේදී ජීවත් වීමට ආහාරය සොයා යන්නේ ආත්ම දෘෂ්ටිය, පිපාසාම හිතේ ඇතිවය. එය අවිද්‍යාව විසින් මෙහෙයවන්නේය. **"සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා"** යනුවෙන් අප බුදුරදුන් වදළ පරිදි ආහාරය මූලිකව ජීවත් වන සත්වයා එම ආහාරය නිසාම නොයෙක් පාපකර්ම සිදුකරන්නේය.

අවිද්‍යාව පිළිබඳව පාරිභාෂික වචන රාශියක් විභංග පාලි අභිධර්ම ග්‍රන්ථයේ දක්වේ. ඒ අනුව සත්වයා පිළිබඳව යථාර්ථවාදී නොවන සෑම කාරණයක්ම අවිද්‍යාවට කේන්ද්‍ර ගත වන්නේය. එසේ වුවද අවිද්‍යාව මූලික ප්‍රකෘති චින්තාවක් නොව සත්වයා පිළිබඳ සංසාර ප්‍රවර්තයේ ප්‍රමුඛතාවයක් ඇති බැවින් අප බුදුරජාණන් වහන්සේ අවිජ්ජා පච්චයා සංඛාරා ආදී ලෙසින් අවිද්‍යාවේ පටන්





හේතුඵල ධර්ම දේශනා කරමින් සංසාර චක්‍රය දක්වා වදාළ සේක.

මහ මුහුදේ අතරමං වූ තැනැත්තා පිපාසය සංසිඳවා ගැනීම සඳහා ලුණුදිය බොන්නා සේ අවිද්‍යාවෙන් අන්ධ වූ පුද්ගලයා රාගාදී ක්ලේශයන්ගෙන් තැවි තැවී ආශ්වාද මාත්‍රයට මුලාවී අනාගතයෙහි කටුක විපාක ගෙන දෙන ප්‍රාණඝාතාදී දුගතිගාමී අකුසල් කරන්නේය. මෙසේ දුගතිගාමී කර්මයන්ට අවිද්‍යාව විශේෂ හේතුවක් වේ.

සාගතයට ළංවෙන ගවයා තමාගේ පරිශ්‍රමය දුරු කරගනු පිණිස සිහිලැල් පානය කරන්නා සේ භවාශාවෙන් පෙළෙන සත්වයා සන්තාව විරහිතව ආශ්වාද සහිත වූ සුගතිගාමීව සැප සම්පත් ලබාගනු වස් දානාදී පිංකම් කරන්නේය. මෙසේ පුඤ්ඤාභි සංඛාර හෙවත් කුසල් සංඛාර රැස්කිරීමටද අවිද්‍යාවම මූලාධාර වන බව අප බුදුරජාණන් වහන්සේ හේතු සාධකව දේශනා කළ සේක. පුහුදුන් මිනිසාගේ භෞතික සම්පත් රැස්කිරීමත්, කුසලාකුසල චේතසික රැස්කිරීමත් පිළිබඳව මෙහෙයවන මහා බලවේගය වන්නේ අවිද්‍යාවයි. සත්වයකු උපන් දා පටන් ජීවිතාන්තය දක්වාත්, මරණින් මතු ආයති භවයටත් අපේක්ෂා ඇතිකර ගන්නේ නාමරූප ධර්මයන්ගේ අනිත්‍ය බව නොදැනීම නමැති අවිද්‍යාව නිසාමය. අවිද්‍යාව ලෞකික වශයෙන් ක්‍රියාත්මක වන සෑම කාර්යයකටම ස්වල්ප වශයෙන් හෝ උපරිම වශයෙන් හෝ මූලික වන නිසාම අවිජ්ජා පච්චයා යනාදී වශයෙන් බුදුරජාණන් වහන්සේ හේතුඵල ධර්මයන්ගේ ප්‍රවේශය දේශනා කළ සේක.

"පුරිමා භික්ඛවෙ කොටි නපඤ්ඤායති, අවිජ්ජාය ඉතො පුබ්බෙ අවිජ්ජානාහොසි අථ පච්ඡා සම්භවීති. ඒවං චේතං භික්ඛවෙ වුච්චති, අථචපන පඤ්ඤායති ඉදප්පච්චයතා අවිජ්ජාති."

මහණෙනි, අවිද්‍යාව මීන් පෙර නොවිය, මින්පසුව හටගත්තේ යයි පෙර කෙළවරක් හෝ හටගත් කාල ප්‍රමාණයක් හෝ නොපෙනේ. එහෙත් මෙය මෙසේ කියනු ලැබේ. මේ හේතුවෙන් අවිද්‍යාව හටගත්තේ යයි පෙනේ.

අවිද්‍යාව මූලම කාරණයක් නොව වෙනත් හේතූන් නිසා උපන් තවත් හේතුවකි. එහෙත් පටිච්ච සමුප්පාදය කොතැනින් හෝ ආරම්භ කළයුතු නිසා බුදුරජාණන් වහන්සේ යෝගතෙම හේතුව වූ අවිද්‍යාවෙන් ආරම්භව "ජාති පච්චයා ජරා මරණං සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස සම්භවන්ති එව මෙතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති." මහා දුක්ඛක්ඛන්ධයක් රැස්කර ගන්නා බව දේශනා කරමින් මෙම ඉදප්පච්චයතා පටිච්ච සමුප්පාදය දක්වූ සේක.

අවිජ්ජා, තණ්හා, සංඛාර, විඤ්ඤාණ යන නාම ධර්මයන් නිසා ඇතිවන උපාදාන හෙවත් අල්වා ගැනීමේ අවශ්‍යතාවය ඇතිවන්නේය. එම හේතූන් නිසා ඇතිවන නාමරූප සළායතන ඵල වශයෙන් සත්වයාගේ උත්පාද, ඨිති, භංග යන ක්ෂණ මාත්‍ර ඇතිවේ. මේ සෑම ධර්මයක්ම චිත්තක්ෂණයක් පාසා වෙනස් වන තමුන් ඇතිවීම, නැතිවීම, යළි හටගැනීම ඉතා වේගයෙන් සිදුවන බැවින් අපගේ ප්‍රකෘති ඇසට නොපෙනෙන තමුත් ප්‍රඥා ඇසට වතුරේ වෙනස් වන දිය බුබුලෙන් වෙනස් වන ආකාරය පෙනෙන්නේය.

"සබ්බේ සංඛාරා අනිච්චා, සංඛාරා නහි සස්සතා" ආදී නයින් බුදුරජාණන් වහන්සේ හේතුප්‍රත්‍ය නිසා හටගන්නා සංස්කාරයන්ගේ ස්වභාවයත්, හිස් බවත් දේශනා කොට වදාළේ අවිද්‍යාවෙන් මුලාවන මෝඩ මිනිසුන් රැස්කර ගන්නා නාමරූප ධර්මයන් අනවරාග්‍ර වූ මේ සංසාර චක්‍රයේම සැරිසරමින් දුක සැප විඳිමින් ජාති, ජරා, ව්‍යාධි, මරණ යන දුක් ඇතුළුව අනේකවිධ දුක් කම්කටොලුවලට භාජනය වන නිසාමය.

ක්ෂණ මාත්‍රයකට ලක්ෂ ගණන් ඇතිවී නැතිවී යළි ඇතිවී විපරිණාම වන්නා වූ නාමරූප ධර්මයන්ගෙන් සංවිත වූ විත්වයේ කිසිම දෙයක් ආත්ම වශයෙන් ගන්නට නොහැකි වුවද පෘථග්ජන මිනිසා අවිද්‍යාවෙන් ප්‍රත්‍යක්ෂඥාණය ආවරණය කරගෙන අතක් මුලක් නොපෙනෙන අති භයානක සංසාර සාගරයට වැටී කෙරපෙන්නේය.

පටිච්ච සමුප්පාදය බුද්ධදහමේ සාරාර්ථය වන අතර එයින් දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරෝධ සත්‍යය, මාර්ග සත්‍යය යන චතුරාර්ය සත්‍ය ප්‍රකාශ වන අතර එය ප්‍රත්‍යක්ෂ ඤාණයෙන් අවබෝධ කරගැනීමට අවිද්‍යාව ක්‍රම ක්‍රමයෙන් නැතිකළ යුතු වන්නේය.

අවිද්‍යාව දුරුවේවා.
විද්‍යාඥාණය පහළ වේවා.
ඔබ සැමට තෙරුවන් සරණයි.

**පූජ්‍ය අමුණුපුර පියරතන හිමි**

"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේද, එබඳු පාප කර්ම නොකිරීම යහපත්ය."

# දෙවි පිහිට ලැබෙන්නේ අදහන්නවුන්ට පමණක්ද?

**දෙවියන්ගේ** පිහිට ලැබෙන්නේ දෙවියන් අදහන අයට පමණක්ද්ද යන්න බොහෝ දෙනකුගේ කුතුහලය දනවන පැනයකි. එමෙන්ම එය නැවත නැවතත් සිතිය යුත්තක් බවට පත්ව තිබේ. එක් එක් ජන සමාජ ගත් විට දෙවියන් ඇදහීම අඩු වැඩි වශයෙන් සිදුවන ආකාරයක් දකිය හැකිය. බටහිර දී දෙවියන් ඇදහීම බොහෝ අඩු වුවද ලංකාව ඉන්දියාව වැනි ආධ්‍යාත්මික පක්ෂයට වැඩි නැඹුරුවක් සහිත රටවල බොහෝ පිරිස් ඉතා භක්තිමත්ව දෙවියන් අදහන බවක් දකිය හැකිය.

මේ අනුව බලන විටදී දෙවියන් වැඩිපුර අදහන ජන සමාජ, දෙවියන් කෙරෙහි එතරම් ලොකු විශ්වාසයක් නොතබන බටහිර රටවලට වඩා වැඩි දියුණුවක් ලැබිය යුතුය. එහෙත් එවැනි තත්ත්වයක් දකිය හැකි නොවේ.





අද වන විට අපි අපි විසින්ම සම්මත කරගෙන ඇති ආකාරයට 'දියුණුව' යයි පිළිගන්නා නිර්ණායකයන් ඔස සැබෑ දියුණුව මනින්න හැකි දැයි සිතිය යුතුය.

වර්තමාන සමාජය තුළ මිල මුදල්, යාන වාහන, ගෙවල් තනතුරු, නම්බුනාම අපි දියුණුව මනින නිර්ණායක සේ දකින්නෙමු.

ඒ සියලු භෞතික මිනිසාගේ සන්තෘප්තියත් පැවැත්මට හේතු සාධක වන බව සැබැවකි. ඒ සාධක මත පමණක්ම මිනිසුන් සැබෑ දියුණුව දකිය හැකි නොවේ. සැබෑ දියුණුව යනු ඒ ආකාරයට භෞතිකව ලබන සැප සම්පත් මත තීරණය වන දියුණුව නොවේ. මා එසේ කියන්නේ ඒ සකල විධ සම්පත් එකරාශිව තිබියදීත් බොහෝ දෙනකුගේ ජීවිත අතිශය අසාර්ථක වන බැවිනි. භෞතික හා ලෞකික සැප සම්පත් අඩු වුවද ඉතා සරල දිවි පෙවෙතක් තුළ සතුට විශයෙන්ම තිබෙන දියුණුවක් තිබිය හැකිය.

'සන්තුට්ඨි පරමං ධනං' යන බුදු වදනින් කියවෙන්නේ සතුට පරම ධනය බවය. නියම දියුණුව සතුට, සැනසුම, නිදහස සංහිඳියාව උදාකර වූ දිවි පෙවෙතකි. එවැනි දියුණුවක් අපේක්ෂා කරන්නකු තුළ යම් ආධ්‍යාත්මික නැඹුරුවක් තිබීම අවශ්‍ය වේ. ආධ්‍යාත්මික ප්‍රවේශයකින් තොරව මානසික සන්තෘප්තිය සමග ගිමි වන නියම දියුණුවක් ලැබීම අසීරු වේ.

ඒ ආකාරයට ආධ්‍යාත්මික දියුණුවක් ලඟා කරගත් අයෙකුට තමන්ටත් අනුන්ටත් යහපතම සැලසෙන ආකාරයට ජීවිතය හැඩගස්වා ගැනීමට හැකියාව ලැබේ. එවිට අප දෙවියන්ට මල් පූජා පවත්වමින් ඇදහීම නොකළ ද දෙවි දේවතාවුන්ගේ ආකර්ෂණය ඇදීම් බැලීම නිරතුරුව ලැබෙනවා. එහෙත් එවැනි තත්ත්වයකට පත්වෙමින් දෙවියන්ගේ ආකර්ෂණය ලැබිය හැක්කේ ප්‍රඥාව මුහුකුරා ගිය අයට පමණකි. ත්‍රිපිටකයේ සංයුක්ත නිකායේ සක්ක සංයුක්තයෙන් කියවෙන එක්තරා කතාවකින් යහපත් දිවි ගෙවන මිනිසුන් හා දෙවියන් අතර පවතින සබැඳියාව මනාව පිළිබිඹු වේ.

සදෙව් ලොව අධිපති සක් දෙවේන්ද්‍රයා සැම උදෑසනකම යම්කුට නමස්කාර කරන අයුරු දකින මාතලී දිව්‍ය පුත්‍රයා ඔබ වහන්සේ සැම නිතිදිපතාම මෙලෙස නමස්කාර කරන්නේ කාටදැයි විමසුහ. එයට පිළිතුරු ලෙස සක් දෙවේන්ද්‍රයා මෙසේ පැවසුහ.

"සිහියම් ගිහියෙකු පින්දහම් කරමින් පන්සිල් පුරමින් ධර්මානුකූලව අඹු දරුවන් ආරක්ෂා කරන්නේ නම් මාගේ මේ නමස්කාරය හිමි වන්නේ ඒ අයට" ඔවය.

මහාචාර්ය දයා අමරසේකර

# සීවලී පූජාව

**සීවලී තෙරුන් වහන්සේට වැඳීම**

පියං දේවමනුස්සානං - බ්‍රහ්මානසද්ද පියං තථා
පියං නාගසුපණ්ණානං - කතකිච්චං අනාසවං
ලාභං ලභන්තං සබ්බත්ථ - වනෙ ගාමේ ජලේ ථලේ
ලාභිනමග්ගතං සත්තං - කත්වාන කුසලං මහං
ජලනිස්සන්දං මහාතේජං - පතින්නපටිසම්භිදං
සුසීලං සීවලීථෙරං - නමාමි සිරසාදරං

**මල් පිදීම**

පියං දේවමනුස්සානං - කුසුමංච මනොහරං
සුසීලං සීවලීථෙරං - පූජේමි කුසුමෙනහං

**පහන් පිදීම**

පියං දේවමනුස්සානං - කුසුමංච මනොහරං
සුසීලං සීවලී ථෙරං - දීපෙන පූජයාමිහං

**සුවඳ දුම් පිදීම**

පියං දේවමනුස්සානං - කුසුමං ච මනොහරං
සුසීලං සීවලීථෙරං - ධූපෙන පූජයාමි හං

**ගිලන්පස පිදීම**

පූජේමි අග්ගලාභිස්ස - සම්මා සම්බුද්ධසාසනෙ
සීවලී ථෙරපාදස්ස - ගිලානපච්චයං ඉමං

**ආහාර පූජාව**

සද දේවමනුස්සෙහි - උපනෙන්තස්ස පච්චයෙ
සීවලී ථෙරපාදස්ස - පූජේමි භොජනං ඉමං



"දෙවුදු වනාම සිරි නොසිඳෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව් විපාක නොමෙරයි. එසැණෙහිම විපාක නොදෙයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් බාලයා දවමින් පසුපස ලුහු බඳී"




# බුදු උපත සිදුවූ ලුම්බිණීය

"මායා සුතෝ සුගත සාකිය සීහ නාථෝ
සො සත්ත පදසා අභිසංකමිත්වා
යස්මිං උදීරයි ගිරං වර ලුම්බිණීම්හි
තං ධාතු චෙතිය මහං සිරසා නමාමි"

ලුම්බිනි සල් උයන බෞද්ධයන්ගේ උත්තම පින් බිමකි. සිද්ධාර්ථ කුමාරයාණන් මහාමායා දේවි කුසින් මෙලොව එළිය දුටුවේ එම පින් බිමෙහිදීය. අතීතයේ ශාක්‍යයන්ගේ අගනුවර වන කපිලවස්තුපුරයටත්, කෝලියයන්ගේ අගනුවර වෙන දෙව්දහ නුවරටත් අතර පිහිටි මෙම සල් උයන දෙරට වැසියන්ට අයිති එකක් වූයේය. මහාමායා දේවියගේ මව්තුමියගේ නමින් එම සල් උයන නම්කර ඇතැයි සැලකේ. එහෙත්, මේ පෙදෙසේ මුල්ම නම වූයේ 'රුක්මිණීදෙයි' ය. රුක්මිණී යනු විෂ්ණුගේ භාර්යාවයි. එම නමින් ප්‍රසිද්ධ වූ රාජ කුමාරියක් නිසා එම නම මේ ප්‍රදේශයට ඇතිවී තිබේ.

වල්බිහිවී තිබූ මේ ස්ථානය 1895 වසරේදී ආචාර්ය ඒ. ෆෙහුරර් මහතා විසින් නිවැරදිව සොයාගෙන තිබිණ. ඊට පිටිවහල් වූයේ අශෝක රජතුමා විසින් පිහිටු වූ ශිලා ස්තම්භයකි. එම සෙල් ලිපියෙහි "දෙවියන්ට ප්‍රිය වූ පියදස්සි රජ අභිෂේකයෙන් විසි වසක් ගත වූ කල තෙමේම පැමිණ වැඳ පුදගෙන මෙහි බුද්ධ ශාක්‍ය මුනිඳුගේ උත්පත්තිය සිදුවී යැයි අශ්ව රූපය සහිත මෙම ශිලා ස්තම්භය පිහිටුවිය. භාග්‍යවතුන් වහන්සේගේ උත්පත්තිය මෙහිදී සිදුවූ බැවින් ලුම්බිනී ග්‍රාමය අයබද්දෙන් නිදහස් කර එහි වැසියන්ට ධනය ලැබීමට සුදුස්සන් බවට පත්කළේය" යනුවෙන් සඳහන් කොට ඇත.



මෙම ලුම්බිනී සල් උයන පිහිටි භූමිය අද නේපාල රාජධානියට අයත්ය. එම භූමියට වර්තමානයේ රුම්මින්දෙයි නමින් ව්‍යවහාර වෙයි. එහි නටබුන් රැසක් අද විසිර පවතී. මහාමායා විහාරය හා දේවාලයක් වශයෙන් සැලකෙන මෙහි සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය දක්වෙන සේ නෙළන ලද ශිලා ඵලකයක් වේ. එහි සඳහන් ගා එම සඳුන් ගර්භනීන්ට දීම මෙහි වැසියෝ අභිරුචියෙන් කරති. එම සඳුන් ගර්භනීන්ට ප්‍රසූත පහසුව දෙන ඖෂධයකැයි ඔවුහු විශ්වාස කරති.


ලුම්බිණිය පිළිබඳ ය්වං චීවාං නමැති චීන භික්ෂුවගේ දේශාටන වාර්තාවේ මෙසේ සඳහන් වේ. ඔහු ලුම්බිණිය ප්‍රදේශයේ සංචාරය කර තිබුණේ ක්‍රි.ව. 629දීය.

ලුම්බිනී උයන ඉතා රමණීයයි. මෙහි ශාක්‍යයන්ගේ නාන පොකුණක්ද වේ. එහි ජලය කැඩපතක් සේ පිරිසිදුය, පැහැදිලිය. පොකුණෙන් උතුරට පියවර විසිපහක් ගිය තැන දිරා ගිය අශෝක රුකක් ඇත්තේය. මෙහිදී වෙසක් පුර පසළොස්වකදා බෝසතුන් උපන්නේය. මෙහි නැගෙනහිර පැත්තේ නාගයන් විසින් බෝසතුන් නැහැවූ ස්ථානයේ අශෝක රජතුමා කරවූ ස්තූපයක් වේ. ඉන් නැගෙනහිර පිරිසිදු දිය උල්පත් දෙකක් ඇත. බෝසතුන් උපන් විගස මින් එකක් ඇල් දියද, අනෙක උණු දියද වූ බව සඳහන් වේ. මෙහි ධර්මාශෝක රජතුමා කරවූ ස්තූප දෙකක් වේ. දෙවියන් ශක්‍රයා බෝසතුන් පිළිගත් තැන කරවූ ස්තූපයක් ඇත. එයට නුදුරින් සතරවරම් රජ දරුවන් බෝසතුන් පිළිගත් තැන කරවූ චෛත්‍ය හතරකි.

ය්වං චීවාං දේශාටන වාර්තාවලින් දක්වූ අශෝක රජ දවසට අයත් ස්තූපයන්ද අද නටබුන් වී පවතී. අද හින්දූන් මෙම ස්ථානය මහාමායා කෝවිල යන නමින් හඳුන්වයි. දැන් මෙහි නේපාල ජාතික හිමිනමක් යටතේ පාලනය වන අලංකාර විහාර ගෘහයක් හා විශ්‍රාම ශාලාවක් වේ.

මෙම ස්ථානය සිද්ධාර්ථ කුමාරයාණන් උපන් තැන බව නේපාල රාජ්‍යය ස්ථිර ලෙසම ප්‍රකාශයට පත්කර තිබේ.

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දමනය වූ කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."




# බුද්ධත්වයට පත් බුද්ධගයාව

පුරාණ දඹදිව මගධ දේශයේ වර්තමාන බිහාර් ප්‍රාන්තයේ ගයා නම් ප්‍රදේශයේ බුද්ධගයා ශුද්ධ භූමිය පිහිටා ඇත. ගයා නම් සාමිවරයා නිසා ඇතිවූ ප්‍රදේශය ගයා නම් වේ. බුදුරජාණන් වහන්සේ සර්වඥතා ඥානය අවබෝධ කොටගෙන බුද්ධත්වයට පත් වූ ප්‍රදේශය බුද්ධගයා නම් වේ. බෞද්ධ ඉතිහාසයේ එන පරම පවිත්‍ර පූජා භූමිය මෙම බුද්ධගයාවයි.

බුද්ධගයාව 'ගයා' දුම්රිය පොළේ සිට සැතපුම් 6ක් ඈතින් පිහිටා ඇත. නේරංජනා ගඟ ගලන්නේ බුද්ධගයා ශුද්ධ භූමියට ආසන්නයෙනි. බුදුන් වහන්සේ සත් සතිය ගත කළ භූමියද ඒ ආශ්‍රිතවම තවම තිබේ. ක්‍රි.ව. 629දී හියුං ච්වාං නමැති චීන පෙරැත් වන්දනාවේ පැමිණි විට බුද්ධගයාවේ භික්ෂූන් වහන්සේලා දහස් නමක් වැඩ විසූ බව සඳහන් වේ.

මීට වසර දෙදහස් හයසියයකට එපිටදී සිද්ධාර්ථ ගෞතම තාපසයන් වහන්සේ සත්‍ය ගවේෂණයෙහි යෙදෙමින් උරුවේලා ජනපදයට වැඩම කළහ. සේනානි නියම්ගම් වැසි සුජාතා සිටු දේවියගේ කිරිපිඩු පිළිගත් සිද්ධාර්ථ තාපසයන් වහන්සේ අනතුරුව "බුද්ධත්වය ලබාගෙන මිස නොනැගිටිමි" යි නම් වූ අධිෂ්ඨාන පූර්වකව ගයාවේ තුඹුල බෝ රුක් සෙවණෙහි වැඩ සිටියහ. වෙසක් පුන් පොහෝ දිනයේ පෙරදා සැදෑ සමයේ සිට පසුදින අලුයම තෙක් කරන ලද දැඩි අධිෂ්ඨානයත්, වීර්යයත්, පුරුදු කරන ලද භාවනාවන් නිසා සියලු කෙලෙස් මැඩ අලුයම යාමයේ සවණක් සම්බුද්ධ පදප්‍රාප්තිය අවබෝධ කරගත් සේක.

බුදුන් වහන්සේට සර්වඥතා ඥානය අවබෝධ කරගැනීම සඳහා සෙවණ දුන්නේ බෝධි වෘක්ෂයයි. බුද්ධත්වය අවබෝධ කරගත් උන්වහන්සේ පළඟින් නොනැගිට අවබෝධ කරගත් විමුක්ති රසය විඳිමින් සතියක් බෝධි මූලයෙහි විවේක සුවයෙන් විසූහ. දෙවන සතියෙහි ජය සිරිමා බෝධියට ඊසාන දෙසින් වැඩ හිඳිමින් තමන් වහන්සේගේ කෘතඥතා පැලකීම වස් දවස් සතක් බෝධිය දෙස ඇසිපිය නොහෙළා බලා සිඳ අනිමිස ලෝචන පූජාවෙන් පූජා කළහ.

බුදුන්ගේත් පූජාවට පාත්‍ර වූ ජයසිරිමහා බෝධියට විවිධ අවස්ථාවල සතුරු උවදුරු පැමිණියේය. අශෝක රජතුමාගේ අන්තඃපුර බිසවුන් විසින් විසකටු ඇනවීමෙන් සිරිමහා බෝධිය වැනසුවාය. අනතුරුව එතනින් හටගත් අංකුරයක් වැවී ඇතිවුණු බෝධිය ශශාංක නම් මිසදිටු රජෙක් උක්පැණි වක්කර විනාශ දමන ලදී. අනතුරුව හටගත් අංකුර බෝධිය ක්‍රි.ව. 1876දී හමනු ලැබූ තද කුණාටුවකට හසුව බිඳී ගියේය. අද බුද්ධගයාවේ වැඩ හිඳින්නේ සිව්වැනි වරට පැන නැංගා වූ බෝධීන් වහන්සේය. එසේත් අනුරාධපුරයේ මහාමේඝ උයනෙහි වැඩ හිඳිනු ලබන්නේ බුද්ධ ස්පර්ශය ලද ජයසිරිමහා බෝධියේ දක්ෂිණ ශාඛාවයි.

තුන්වන සතියේදී බුදුන් වහන්සේ ජය ශ්‍රී මහා බෝධියත්, උන්වහන්සේ අනිමිස ලෝචනයේ වැඩ සිටි චංක්‍රමණයත් අතර රුවන් සක්මන මවා සතියක් ගත කළහ.

සිව්වන සතියෙහි බෝරුකින් වයඹ පැත්තට වන්නට යාර හයසියයක පමණ දුරින් පිහිටි තැනෙක රුවන් කුටියක වැඩ හිඳිමින් අවබෝධ කරගත් මුළු දහම මෙනෙහි කළහ.

පස්වන සතිය බුදුන් වහන්සේ වැඩ වාසය කළේ අජපල් නුගරුක මුලය.

සයවන සතියේ මුචලින්ද නම් විල සමීපයෙහි මිදෙල්ල ගසක් මුල වැඩ හිඳිනා විට හටගත් වරුසාවෙන් බුදුන් වහන්සේ ආරක්ෂා කරගැනීමට මුචලින්ද නම් නා රජ පෙනය ඉදිරිපත් වූ බව කියැවේ. ජය ශ්‍රී මහා බෝධියට සැතපුම් එකහමාරක් පමණ දුරින් නේරංජනා ගඟෙහි උඩ පෙදෙසෙහි පිහිටා ඇති මෙම විලට අදත් මුචලින්ද විල ලෙස වහරති.

සත්වන සතියේ සර්වඥයින් වහන්සේ මුචලින්ද විල සමීපයෙහි කිරිපලු රුක මුල වැඩ සමවත් සුවයෙන් විසූහ.

වර්තමානයේ අප වඳින පූජා බුද්ධගයා විහාරය ධර්මාශෝක රජතුමා විසින් කරවන ලද අපූරුම කලා කෘතියකි. සාත මාලයේ සිට විහාරයේ සොත් වහන්සේ දක්වා ඇති සෑම කවුළුවකම බුදුන් වහන්සේගේ විවිධ මුද්‍රා සහිත අලංකාර බුද්ධ ප්‍රතිමා වේ. විහාරය ඇතුළේ භූමි ස්පර්ශ මුද්‍රාවෙන් වැඩ හිඳිනා බුදු පිළිමයකි. මෙය ශ්‍රී ලාංකික කලාකරුවන්ගේ නිර්මාණයක් බව කියැවෙන මතයක්ද පවතී.

බුද්ධගයාව බෞද්ධයන්ගේ පුදබිමක් කරනු ලැබුවේ අනගාරික ධර්මපාලතුමන් විසිනි.



අද බුද්ධගයාව ශ්‍රී ලංකාවාසී බෞද්ධ භික්ෂූන්ගේ සහභාගිත්වයෙන් ඉන්දියානු රජයෙන් පත්කළ විශේෂ කාර්ය මණ්ඩලයක් යටතේ පාලනය වේ.

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."




# බුදුරජුන් පිරිනිවන් පෑ කුසිනාරාව

පාවා නුවරින් චුන්ද කාර්මාර පුත්‍රයාගේ දානය පිළිගත් බුදුරජාණන් වහන්සේට ලෝහිත පක්ඛන්දිකා නම් රෝගය නැවත ඉස්මතු විය. පිරිනිවීමට කුසිනාරා නුවර වඩින උන්වහන්සේගේ අසනීප තත්ත්වය නැවත මතුවී ශරීරය ක්ලාන්ත වූ බව දැනිණ. අනතුරුව වඩින මගින් ඉවත්ව පාර අයිනේ වූ ගසක් මුල උන්වහන්සේ විවේක ගත් සේක. ආනන්ද හිමියන් අමතා සඟල සිවුරු හතර පටකට නවා ආසනයක් තනවාගෙන එහි වැඩ හුන්හ. ආනන්ද තෙරුන් ලවා පැන් ගෙන්වාගෙන වැළඳූහ. අනතුරුව එතැනින් යන්නට පැමිණි ආලාරකාලාම තවුසාගේ සව්වකු වූ පුක්කුස නම් මල්ල රාජ පුත්‍රයාගේ දහම් ගැටලු විසඳා දී ඔහුගේ වස්ත්‍ර පූජාව පිළිගත්හ. මෙදක් සුවපත් වූයෙන් භික්ෂු සංඝයා සමඟ කුකුත්ථා නදියට වැඩම කරවා පැන් සනහාගෙන මල්ල රජදරුවන්ගේ උපවත්තන නම් සල් උයනට වැඩියහ.

එතැනදී උන්වහන්සේට ක්ලාන්ත ගතියක් දැනිණ. සැතපීම සඳහා දෙපට සිවුරු සතරකට නවා සකස් කර ආසනයක් පනවන ලෙස ආනන්ද තෙරුන්ට දන්වූ සේක. එම ආසනයේ උන්වහන්සේ සිංහ සෙය්‍යාවෙන් සැතපුණහ.

බුදුන් වහන්සේ පිරිනිවන් පෑමට ආසන්න බව දත් ආනන්ද තෙරණුවෝ ශෝකයෙන් කම්පා වූහ. ආනන්ද තෙරුන් අමතා බුදුන් වහන්සේ සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය බව අවබෝධ කොට දුන්හ.

අනතුරුව එදින රාත්‍රියේ තථාගතයන් වහන්සේ පිරිනිවන් පාන බව මල්ල රජ දරුවන්ට දන්වන ලෙස ආනන්ද හාමුදුරුවන්ට නියම කළහ. ඒ බව ආනන්ද හිමියෝ මල්ල රජදරුවන්ට දන්වූ විට ඔවුහු පැමිණ පිරිනිවන් මංචකය අබියස එකත්පස්ව හුන්හ. එද රාත්‍රී පශ්චිම යාමයේදී බුදුන් පිරිනිවන් පාන බව ඇසූ සුභද්‍ර නම් මහළු පිරිවැජියා බුදුන් වෙත පැමිණ පූර්ණ කාශ්‍යපාදීන් ප්‍රතිඥා කළ පරිදි දුකින් මිදීමට මාර්ගය විචාළහ. ඒ දේවල් විස්තර කිරීමට අවකාශ නොවූයෙන් තමන් වහන්සේ අවබෝධ කරගත් පරිදි දුකින් මිදෙන මග දේශනා කළෙන් ඒ ඇසූ සුභද්‍ර උයනේ කොනකට වී භාවනා කර ධර්මාවබෝධ කොටගෙන උපසම්පදාව ලැබූහ. සුභද්‍ර බුදුරදුන්ගේ අවසාන ශ්‍රාවකයා විය.


රාත්‍රී පශ්චිම යාමයේ ආනන්ද හිමියන් අමතා පශ්චිම අවවාද දුන් බුදුන් වහන්සේ කිසියම් ධර්මයක් පිළිබඳ සැකයක් ඇත්නම් එය අසා විමසන ලෙස දන්වූහ. සියලු භික්ෂූන් වහන්සේලා නිශ්ශබ්ද වූහ. අනතුරුව ප්‍රථම ධ්‍යානයේ සිට අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ධ්‍යානයන්ට සමවැදුණු බුදුන් වහන්සේ චතුර්ථධ්‍යානයෙන් නැගී සිටීමට අනතුරුව නිරුපධිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑහ.

කුසිනාරාවේ උපවත්තන සල් උයනෙහිදී බුදුන් පිරිනිවන් පෑ අයුරු දක්වන අපූරු ප්‍රතිමාවක් අද කුසිනාරාවේ වේ. එම පිළිම වහන්සේ දුටුවන්ගේ නෙත්හි කඳුළු නැංවෙයි. දුන් දුක් පිරිනිවන් පෑ ආකාරයක් එම පිළිමයෙන් පිළිබිඹු වේ. එය 'හරිබල' නම් වූ භික්ෂුවක් විසින් නෙළන ලද බව සඳහන් වේ.

තවද උපවත්තන සල් උයනෙහි බුදුන් පිරිනිවන් පෑ තැන පරිනිර්වාණ චෛත්‍යය නම් වූ චෛත්‍යයක් පිහිටුවා තිබේ. කුකුත්ථා නදිය ඇත්තේ මේ සමීපයෙහිය.

බුදුන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කළ ස්ථානයේ අගනර චෛත්‍යය නොහොත් ආදාහන චෛත්‍යය පිහිටුවා තිබේ.

පූජ්‍ය රුවන්පුර ඤාණවිමල හිමි





# සසර දුකින් මිදීමට
# බුදුහිමි සරණ මිස
# නැත අන් කිසිදු සරණක්




"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් මිදුන් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

සම්බුදු උපතින් මෙයින් වසර 2603කට පෙර එළඹුණු අති උතුම් වෙසක් පුන් පොහෝ දිනයක, ලොවට ශාන්තිය පිණිස දෙව්මිනිසුන්ගේ ඇරයුමෙන් කපිලවස්තු නම් රජත නගරයෙහි රජකළ සුද්ධෝදන මහරජුගේ අගබිසව් මහමායා දේවීන් කුස පිළිසිඳ දස මසක් සම්පූර්ණ වූ කල්හි බෝසතුන් ලොවට බිහිවූ කෙනෙහි දෙව්වරු සතරදෙනෙක් අවුත් රන්දැලින් පිළිගත්හ. ඔවුන්ගේ අතින් වරම් රජවු ද, ඔවුන් අතින් අමාත්‍යයෝ ද පිළිගත් පසු බෝසතුන් සත්පියුමක් මතින් සත්පියවරක් ඉදිරියට තබමින් නොව, සක්විත පියවරෙහි සිට, "අග්ගොහමස්මි ලොකස්ස..." යනාදී වශයෙන්, "මම ලොවට අග්‍ර වෙමි, ජ්‍යෙෂ්ඨ වෙමි, ශ්‍රේෂ්ඨ වෙමි. මේ මාගේ අන්තිම ඉපදීමය. දැන් මට පුනර්භවයක් නැත" යි යන ඒ අභීත සිංහ නාදය පැවැත්වූහ. මහමායාදේවී කුසින් බිහිවූ කුඩා කුමරුවා සිද්ධාර්ථ නමින් නම් කළ අතර, ගෞතම නම් ගෝත්‍ර නාමය ද ලැබුවේය. පියාණන් උපන් මෙම පින්වත් කුමරුවා කෙමෙන් කෙමෙන් තරුණවියට පැමිණ කෝලිය රජතුමාගේ දියණිය වූ යශෝධරා සමග විවාහපත් විය. යශෝධරාවන් සමග ගිහිසැප විඳිමින් සිටින අතර දිනක් උයන්කෙළි පිණිස යද්දී මාර්ගයේදී සැරයටියක් අතින් ගෙන වෙව්ලමින්, ඇඟ රැලි වැටුණු, කුදු ගැසුණු මහල්ලෙකු ද, දරුණු රෝගයකින් පෙළෙන ලෙඩෙකු ද, මියගිය තැනැත්තෙකුගේ මළකඳක් ද, සතරවෙනුව අස පුවු කළ කසාවත් හැඳගත් පැවිද්දෙකු ද යන සතර පෙරනිමිති හා නාටිකාංගනාවන්ගේ විරූපාකාර දැක, මෙලොව උපන් හැම සෙනෙකුටම මෙබඳු ඉරණමකින් අත්මිදෙන්නේ නැති දැන සසර කලකිරී, රාහුල කුමාරයාගේ උපත ලත් ඇසළ මස පුර පසළොස්වක පොහොය දිනයකදී සසර විමුක්තිය සොයා රජසැප සැප අතහැර අභිනිෂ්ක්‍රමණය කොට තපස් දිවිය පෙරාරාණිස්සේය. ඉපදීම, මහලුවීම, මරණය හා පුනර්භවය පැවතීම දුකට හේතුවන බැවින් ඉන් මිදීම සඳහා උගන්වන ඇසිය. සසර දුකින් නිදහස් වීමේ අදිටනින් සත්‍ය මාර්ග ගවේෂණයක යෙදෙමින් වසර සයක් තිස්සේ දුෂ්කර ක්‍රියා කොට අත්තකිලමථානුයෝගයෙන් හෝ කාමසුඛල්ලිකානුයෝගයෙන් යන අන්ත දෙකෙන් එකකින්වත් සත්‍ය අවබෝධ කරගත නොහැකි බව වටහා ගත්තේය. අනතුරුව නේරංජනා ගඟ අසබඩ පිහිටි උරුවෙල් ගමට ගොස් එහි බෝරුකක් සමීපයෙහි වැඩසිටි කල්හි සුජාතාව නම් සිටු දියණිය පිළිගැන්වූ කිරිපිඩු දානය වළදා කළ අදිටනින් පසු මධ්‍යම ප්‍රතිපදාවෙන්, ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි පිහිට, ඔවුන් වඩා සත්‍ය සතර අවබෝධ කොට සියල් ලෝසතුන්ගේ සියලු දුක් නිවීම සඳහා බුද්ධත්වයට පැමිණ වදාළ සේක. අවසානයේ සිදුහත් තවුසාගේ මහත් වීරයාගේ හා ඥානී පරිත්‍යාගයේ ප්‍රතිඵලයක් වශයෙන් භාවනා මාර්ගය ඔස්සේ අතිශ්‍රේෂ්ඨ නිර්වාණය සාක්ෂාත් කරගත් සේක. අතිශ්‍රේෂ්ඨ බුද්ධත්වයට පැමිණ වදාරා,

"අනෙකජාති සංසාරං
සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො
දුක්ඛාජාති පුනප්පුනං

ගහකාරක දිට්ඨොසි
පුනගෙහං න කාහසි
සබ්බාතෙ ඵාසුකා භග්ගා
ගහකූටං විසංඛිතං
විසංඛාරගතං චිත්තං
තණ්හානං ඛය මජ්ඣගා"

යනාදී වශයෙන් "නැවත නැවත ඉපදීම දුකක්ය. එබැවින් අත්බවයට තමැති ගෙය සාදන තණ්හාව නමැති වඩුවා දැකීමට සමත් බෝධිඥාණ ඇස පතා මේ තාක් සියදහස් ගණන් ජාති ඇතිව අනන්ත කාලයක් සසර පුරා ජීවිතය නැමැති ගෙවල්වලට මම අනූව සිටියෙමි. තණ්හාව නිසා සීරුමැදිව සිටිව පස්කඳ දුකින් පිරුණු ගෙය තැනු අය නොසොයින් සිටියෙමි. දැන් ඒ ගෙය සාදන ලද මම, මම දුටිමි. දුකින් පිරුණු අත්බවය නමැති ගෙය මම මට මින්මතු නොසාදන්නෙහිය. මගේ කෙසු කෙළෙස් නමැති පරාල මා විසින් සිඳබිඳ දමන ලදී.




අවිද්‍යා නමැති කැණිමඩල පලා දමන ලදී. මසිත අරමුණු කිරීම් වශයෙන් නිවන් කරා පැමිණියේය. මෙසේ තණ්හාව ප්‍රහීණ කොට මම රහත් මඟඵලයන් ලැබීමි."

මෙසේ තමන්වහන්සේ අවබෝධ කරගත් ගැඹුරු ධර්ම මාර්ගය, අවබෝධ කරගත හැක්කේ කාටදැයි විමසා බලා, තමන්වහන්සේ සමග දුෂ්කර ක්‍රියා කරමින් තපස් දැරූ පස්වග මහණුන් හට කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම, අස්සජි යන පස්වගය පළමුව මෙම දහම් අසා ගෙලින් දීම වැදගත් යැයි සිතා, ඔවුන් හමුවීමට වැඩමකළ තැනින්, පළමුව ඔවුන්ගෙන් යහපත් ප්‍රතිචාරයක් නොලැබුණු තැනින්, තමන්වහන්සේ විසින් තමාටම ගුරුවරයෙකු වී අවබෝධ කරගත් ශ්‍රේෂ්ඨ ධර්මය පිළිබඳ වනුය ඔවුනට දේශනා කිරීමට පැමිණි බවත්, තමන්වහන්සේ බුද්ධත්වය ලද බවත්, උත්පත්තිය පිළිබඳ දුකින් මිදීමට මාර්ගය පෙන්වන බවත් ප්‍රකාශ කළ සේක. අනතුරුව ප්‍රථම ධර්ම දේශනාවට දී මෙම පස්දෙනාට අත්තකිලමථානුයෝගය, කාමසුඛල්ලිකානුයෝගය යන අන්තයන් අත්හැර මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කර, ආර්යඅෂ්ටාංගික මාර්ගයෙහි ගෙදී චතුරාර්ය සත්‍යය තුළින් හේතුව හඳුනාගැනීමට මගපෙන්වූ සේක. දුක ඇතිවන්නේ ඉන්ද්‍රියන් පිනවීමට ඇති ආශාව නිසා යන බව මැනවින් අවබෝධ කරදුන් සේක. මෙම පළමු ධර්ම දේශනාව ශ්‍රවණය කළ කොණ්ඩඤ්ඤයන් වහන්සේ ප්‍රථම සෝවාන් පුද්ගලයා බවට පත්විය. එහිපිහිල්ලුවයෙන් පැවිදි උපසම්පදාව ලැබීය. ප්‍රථම ධර්ම දේශනාවෙන් පසු පන්සාලිස් වසක් තිස්සේ සදහම් ආලෝකයෙන් ලොව එකලු කළ උත්තමයන් බුදුරජුන් මෙයින් 2558කට පෙරාතුව අද වැනි අසිරිමත් වෙසක් පුන් පොහොය දිනයක දී, කුසිනාරාපුර මල්ල රජදරුවන්ගේ උපවත්තන නම් සල් උයනේදී සල් රුක් අතරෙහි පිළියෙළ කළ සයනයෙහි සිංහ සෙය්‍යාවෙන් හැසිර, සුභද්‍ර නම් පරිබ්‍රාජකයාට දම් දෙසා, පසු ආනන්ද තෙරුන්වහන්සේ ලවා පැවිදි කරවා, ආනන්ද තෙරුන්වහන්සේ අමතා "තමන්වහන්සේගේ ඇවෑමෙන් ධර්ම විනය දෙක ශාස්තෘවරයාණන්වහන්සේ වශයෙන් සලකන්නැයි දන්වා,

"හන්දදානි භික්ඛවේ ආමන්තයාමිවො
වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ"

"මහණෙනි, දැන් මම අමතමි. සියලු සංස්කාරයෝ නැසෙන සුළුය. එබැවින් නොපමාව, එළඹ සිටි සිහියෙන් රහත්බව පිණිස කළයුතු දෑ සපයා ගන්න" යන අන්තිම බුද්ධවචන ද දෙසා වදාරා, සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යතාව අඟවමින් නිරුපධිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන්පා වදාළ සේක.

ගුණ මහිමයෙන්, ප්‍රඥා මහිමයෙන් පිරුණු තථාගතයන්වහන්සේට වඩා ඉහළ සිටිය හැක්කෙක් කවරෙක්දැයි ... රාගාදී කෙලෙස්වලින් මිදුණු බුදුන්වහන්සේ පන්සිය පස් වසරක් තිස්සේ සිදුකළ දහම් සේවය, ලොව්වැඩ සේවාව, දෙසූ සාරධර්ම පද්ධතිය, ඉතා ශ්‍රේෂ්ඨය. ජීවිතයේ සියලු දුක්, දොම්නස්, අභාග්‍යකරභවයන් උන්වහන්සේගේ ධර්මය තුළින් ජයගත හැකිය. ඒ නිසාම සමස්ත ලෝකවාසීන්ගේම ගෞරව පූජෝපහාරයට පාත්‍ර වූහ. බුදුරජාණන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ ඥාන සම්භාරය සමග සංයෝජනය වූ මහාකරුණාව, දයාව, ඒ ප්‍රඥාවේ උදාරත්වය අඳුරින් ප්‍රකට කරයි. අවිද්‍යාව, මෝහය දුරුකිරීමට අවශ්‍ය මාර්ගය බුදුන්වහන්සේ දේශනාකොට වදාළ සේක. ඒ උතුම් ධර්ම මාර්ගය මෛත්‍රියෙන් පමණක් නොව ලෝකයේ සැම කෙනෙකුටම පොදු දහමක් ලෙස සදාකල් පවතිනු ඇත. වෛරය, හිංසනය, ප්‍රචණ්ඩත්වය, මිනිසුන් මධ්‍යයේ ඇති වර්තමාන ලෝකයට බුදුරජාණන්වහන්සේ දේශනාකොට වදාළ ධර්මය පිළිසරණ වනු ඇත. පොහොසත් පැවතුම් ජීවිත විමුක්තිය සැලසීම පිණිස මහත් සේ උපකාරී වන්නේය. මෙම උතුම් වෙසක් පුන් පොහෝ දිනයේදී ඒ උතුම් දහම් මඟෙහි ගමන්කිරීමට අප ද අදිටන් කරගනිමු. තෙරුවන් සරණයි.



# ඔබේ නිවන් මග අවුරන අකුසල් 5 ගැන දැනගන්න

අද දළඳා වරුණ දහම් සතරාව තුළින් මම බලාපොරොත්තු වන්නේ නිර්වාණගාමී මාර්ගය වළක්වාලන අකුසල ධර්ම පහක් වන පංච නීවරණ ධර්මයන් ගැන අංගුත්තර නිකායේ නීවරණ සූත්‍රය ඇසුරින් ධර්මානුකූල විවරණයක් සැපයීමටය.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩසිටින කාලයෙහි මෙම සූත්‍රය දේශනා කළ සේක. සිත අවුරාගෙන සිටින හෙයින්ද, ධ්‍යානාදීන්ට බාධක වන හෙයින්ද, නීවරණ යනුවෙන් සඳහන් වේ. නිර්වාණගාමී මාර්ගය සම්පූර්ණයෙන්ම වළක්වා සිත දූෂිත කරන හා ප්‍රඥාව දුර්වල කරන්නට සමත් අකුසල ධර්ම වශයෙන් පෙන්වා දී ඇත. එහි ප්‍රධාන වශයෙන් පහකි. එය පංච නීවරණ ධර්ම ලෙසින් දක්වා තිබේ. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධය, උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡා වශයෙනි.

බුදුදහම් තුළ සඳහන් වන ප්‍රධාන භාවනා ක්‍රම දෙක වන සමථ හා විදර්ශනාවන් අතර සමථ භාවනාවෙන් සිදුවන එක් වැදගත් ප්‍රතිඵලයක් වන්නේ පංච නීවරණ ධර්මයන් යටපත් කිරීමයි. නීවරණානං පහාණීති සමථො වශයෙන් දක්වා ඇත. නීවරණ ධර්මයන් දුරු කරනුයේ සමථය නම් වේ. මේ නීවරණයන්ගෙන් මැඩුණ සාමාන්‍ය පුද්ගලයාගේ සිත මාරයාට කැමැත්තක් කරන්නට ඉඩ හළ සිතකි. (යථා කාමං කරණීයෝ පාපිමතො) එසේ හෙයින් බුදුරජාණන් වහන්සේ මෙසේ වදාරති.

"මහණෙනි, මේ පංච නීවරණයන්ගෙන් ආවරණය වූ ඉන් මැඩුණ බැවින්, පංච ආවරණයන්ගෙන් අබල දුබල වූ ප්‍රඥාවෙන් ආත්මාර්ථයද නොදනියි. පරාර්ථයද නොදනියි. උභයාර්ථයද නොදනියි. මනුෂ්‍ය ධර්මය ඉක්ම වූ ආර්යඥාණ දර්ශන විශේෂයක් සාක්ෂාත් කරන්නේය යන්නක් නොවේ වශයෙනි. නීවරණ සහිත සිත කාමයෙන් හා අකුසලයන්ගෙන් යුක්තය. නීවරණයන්ගෙන් මැඩුණ පුහුදුන් පුද්ගලයා කාමය වෙන්විය යුත්තක් බව දන්නේ නැත. කාමය බලගතු වන පමණට ව්‍යාපාදය, ද්වේශය, ගැටෙන සුළු බව පවතී. මෙය අකුශලයට පදනමය. ඒ නිසා කාමයෙනුත්, අකුශලයෙනුත් වෙන්වීම බුදු සමයේ විවේකය වශයෙන් හැඳින්වේ."

නීවරණ සූත්‍රයට අනුව පළමු කාරණය වන්නේ කාමච්ඡන්දයයි. කාම යනු වස්තු කාම හා ක්ලේශ කාමයයි. ඡන්දය යනු කැමැත්තයි. පස්කම් සැපතට ඇති කැමැත්ත මෙයින් අදහස් කරති. ඇසට-රූපය, කනට-ශබ්දය, නාසයට-ගඳ, සුවඳ, දිවට-රස, ශරීරයට-ස්පර්ශ වශයෙන් අභ්‍යන්තර ඉන්ද්‍රියයන් බාහිර අරමුණු සමග එක්වීමයි. පංච කාම වස්තූන් මමය, මාගේය යන හැඟීමෙන් ග්‍රහණය කරගැනීමයි. ප්‍රිය රූපේ රූපේ සාරජ්ජති අප්පිය රූපේ රූපේ බ්‍යාපජ්ජති. ප්‍රිය රූපයන් කෙරෙහි ඇලීමත්, අප්‍රිය රූපයන් කෙරෙහි ගැටීමත්



"වෛර සහිතව ජීවත් වන මිනිසුන් අතුරෙහි වෛර රහිතව ඒකාන්තයෙන්ම සුවසේ ජීවත් වන්න. වෛරී මිනිසුන් මැද අවෛරීව ජීවත් වන්න."

කාම ඡන්දයේ ප්‍රතිඵලයකි. ඇස ප්‍රිය රූප දැකීමට කැමති වෙයි. කන මිහිරි ශබ්ද ඇසීමටත්, නාසය මිහිර සුවඳටත්, දිව මිහිරි රසයටත්, ශරීරයට සුවදායක ස්පර්ශයටත් ස්වභාවයෙන්ම කැමති වෙයි. මෙය කාම ඡන්දය නම් වේ. කාම ඡන්දය උපදින්නේත් වැඩෙන්නේත් රූපාදී අරමුණුවල ශුභ වශයෙන් නිමිත්ත ගැනීම නිසාය. කාම ඡන්දය ප්‍රහාණය කිරීමට හේතුවන කරුණු හයක් දක්වා තිබේ. අශුභ නිමිති හැදෑරීම, අශුභ භාවනාවෙහි යෙදීම, ඉන්ද්‍රිය සංවරය, ආහාරයේ පමණ දැනීම, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, කාම ඡන්දය දුරු කිරීමට අදාළ කතා ඇසීම යන හයයි. කාම ඡන්දය නීවරණය සහ මුලින්ම නැසෙන්නේ අනාගාමී මාර්ග යෙනි.

දෙවෙනි කාරණය වන්නේ ව්‍යාපාදයයි. එනම් අනුන් වැනසීමේ අදහසයි. එය ක්‍රෝධයට වඩා බලවත්ය. ක්‍රෝධය වනා කිපී ඇනුම් බැණුම් ආදියෙන් සන්ටයා පොළඹවයි. එහෙත් ව්‍යාපාදය එසේ නොවේ. හෙමින් හෙමින් සිය සතුරා නැසීම පිණිස සැලසුම් කරයි. ද්වේශයෙම සතුරා නැසීමට තරම් දියුණු වූ විට ව්‍යාපාද යයි කියනු ලැබේ. ව්‍යාපාදය සිත දූෂ්‍ය කරයි. පිත්තු වූ මිනක් වැනිය. එය ඉවත දමනවා මිස වෙනත් ප්‍රයෝජනයක් නැත. එසේම ව්‍යාපාදයෙන් දූෂිත වූ සිතකින් කිසි ප්‍රයෝජනයක් ගත නොහැකිය. අද සමාජයේ බොහෝ සෙයින්ම පුද්ගල ඝාතන සිදුවන්නේ මෙම ව්‍යාපාදය නමැති අකුසල ධර්මය ව්‍යාපාදය නිසාය. ප්‍රහාණය පිණිස හේතුවන කරුණු හයකි. මෛත්‍රී භාවනා නිමිති හැදෑරීම, මෛත්‍රී භාවනාවේ යෙදීම, කර්මය ස්වකීය කොට සිතීම, නුවණින් සලකා බැලීම, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, ව්‍යාපාදය දුරුවීමට අදාළ කථා ශ්‍රවණය කිරීම, ව්‍යාපාද නීවරණ ධර්මය අනාගාමී මාර්ගයේදී සහමුලින්ම නැතිවන්නේය.


බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බවයි. (නහි වේරේන වේරානි) වෛරී සමාජය තුළ අවෛරීව සැපසේ ජීවත් වීම අගය කොට සලකයි.

"සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනො
වේරිනේසු මනුස්සේසු - විහරාම අවේරිනො"

නීවරණ ධර්මයන්ගේ තුන්වැනි කාරණය වන්නේ ථිනමිද්ධයයි. සිතේ අලස බව ථිනයයි. වේදනා සංඥා සංඛාර හා නාම කායේ අලස බව මිද්ධයයි. මෙයින් පෙනී යන්නේ සිතේ හා කයේ අලසකම හෙවත් මැලි බව ථිනමිද්ධය වශයෙන් දක්වා ඇති බවයි. නාම රූපයන්ගේ අලස බව එකවර සිදුවන්නේය. ථිනමිද්ධයෙන් යුතු පුද්ගලයා බන්ධනාගාර ගත වූවකු වැනිය. බන්ධනාගාරයක සිරවූවකුගෙන් එළිමගනේ තිබුණු නැකැත් උළෙලක මුල, මැද, අග විස්තර ඇසුවාට ඵලක් නැත. එයට හේතුව බන්ධනාගාරය අඳුරු කුටියක් බැවිනි. එසේම ථිනමිද්ධයෙන් යුතු පුද්ගලයා කොතරම් වැදගත් ධර්ම කතාවක් ශ්‍රවණය කළත් එහි මුල, මැද, අග කිසිවක් විස්තර කිරීමට සමත් නොවේ. මේ නිසා ඔහුට කිසිදු විශේෂ ගුණයක් ලබාගත නොහැකිය. කම්මැලි පුද්ගලයා සමාජයේ කිසිදු දෙයක් ජයගන්නේ නැත. උත්සාහයෙන් යුතු පුද්ගලයාම දියුණු වේ. (උට්ඨානවතො).

දැඩි අධිෂ්ඨාන වීර්යය හා උත්සාහය පුද්ගල දියුණුවට අත්‍යවශ්‍ය සාධකයකි. "උද්‍යමෙනහි සිද්ධ්‍යන්ති කාර්යාණෙන මනො රථෛ:" උත්සාහයෙන් තොර කාර්යයන් සඵල නොවේ. එම නිසා අප සවුරුත් උත්සාහය හා වීර්යය ඇති කරගෙන කටයුතු කිරීම අවශ්‍යය. ථිනමිද්ධය ඇතිවීමට හේතුවන කරුණු පහකි. කුසල ධර්මයෙහි නොඇලීම, අලස බව, ඇඟමැලි කැවීම, බත්මතය හා සිතෙහි අකර්මන්‍ය බව යන මේවාය. ථිනමිද්ධය ප්‍රහාණය කළ හැක්කේ වීර්යයෙනි. ථිනමිද්ධය දුරු කිරීමට හේතුවන ධර්ම කිහිපයකි. නිදිමත ගති ඇතිවූ විට ඉරියව් මාරු කිරීම, නිතර ආලෝකය ගැන මෙනෙහි කිරීම, ගේ දොර ගස් කොළන් ආදියෙන් බැහැර එළිමහනක විසීම ආදියයි. ථිනමිද්ධ නීවරණය අර්හත් මාර්ගයේදී සහමුලින්ම දුරු වන්නේය.

නීවරණ ධර්මයන්ගේ සිව්වැන්න උද්ධච්ච කුක්කුච්චයයි. (උද්ධතස්ස භාවො උද්ධච්චං) නොසන්සුන් බව උද්ධච්චය වශයෙන් දක්වයි. සිත එක් අරමුණෙහි නොපිහිටා නොසන්සුන්ව නොයෙක් අරමුණෙහි විසිර පැවතීම උද්දච්ච නම්,



නොකළ හොඳ ගැනත්, කළ වරද ගැනත් ඇතිවන පසුතැවිල්ල හා කැප දෙයෙහි අකැපය, අකැප දෙයෙහි කැපය, නිවරදෙහි වරදය යනාදී වශයෙන් පහළ වන කුකුසද කුක්කුච්ච නම් වේ. උද්දච්ච කුක්කුච්චය නිසා පුද්ගලයාට කිසිවක් එක දිගට කරගෙන යාම අපහසුය. ඉක්බිම බාධා පැමිණෙන්නේය. උද්ධච්ච කුක්කුච්චයෙන් යුතු තැනැත්තා නැකැත් කෙළි කෙළන දසයකු මෙනැයි සඳහන් වේ. දසයා නැකත් කෙළිනවිට ස්වාමියා නියෝග කළ මොහොතේම ක්‍රීඩාව අතහැර ඒ ඒ

අවශ්‍යතා ඉටුකළ යුතුය. එමනිසා එක දිගට එය රස විඳිය නොහැකිය. එසේම යම් පුද්ගලයාද විවේකස්ථානයට ගොස් භාවනා කරන විට, ඉතා සුළු දෙයෙහි පවා සැක ඇති කොට ඒවා විසඳා ගන්නට යාමෙන් භාවනාවට බාධා කරගන්නේය. සිතෙහි නොසන්සුන් බව නැති කොට සිත සන්සුන් කරගැනීම සඳහා ඉවහල් වන කරුණු හයක් දක්වා තිබේ. ධර්ම පිළිබඳ බහුශ්‍රැත බව, කැප අකැප ආදිය පිළිබඳ සැක තැන් විචාරා දැනගැනීම, විශේෂයෙන් විනයෙහි දක්ෂ බව, නුවණින් වයසින් වැඩිහිටි තෙරවරුන් ඇසුරු කිරීම, උද්ධච්ච කුක්කුච්චය ප්‍රහීණ කළ උතුමන් ඇසුරු කිරීම, සතර ඉරියව්වෙහිදීම උද්ධච්ච කුක්කුච්චයට විරුද්ධව කතා කිරීම හා ඇසීම යන කාරණාවන්ය. මෙය අර්හත් මාර්ගයෙන් ප්‍රහීන වන අකුසල ධර්මයකි.

නීවරණ ධර්මයන්ගේ පස්වන කාරණය වන්නේ **විචිකිච්ඡාවයි**. විචිකිච්ඡාව යනු සැකයයි. බුද්ධාදී අටතැන් පිළිබඳ සැකයයි. මෙහි විරුද්ධාර්ථය විශ්වාසයයි. සැකයෙන් කටයුතු කරන පුද්ගලයාට යහපතක් සිදු නොවේ. සැක පහළ කරගෙන කටයුතු කිරීම පුද්ගලයාගේ විනාශයට හේතුවකි. පවුල් ඒකකය තුළදී ස්වාමි භාර්යාව හා ස්වාමි පුරුෂයා අතරද, දූ දරුවන් හා දෙමාපියන් අතරද විශ්වාසය නැති තැන දුක් ගොඩකි. ප්‍රශ්න රාශියකි. සතුට, සැනසීම ලබාගැනීමට නම් විශ්වාසය අත්‍යවශ්‍ය කාරණයකි. 1. බුද්ධත්වය කෙරෙහි සැක කිරීම, 2. ධර්මය කෙරෙහි සැක කිරීම, 3. සංඝරත්නය කෙරෙහි සැක කිරීම, 4. ත්‍රිවිධ ශික්ෂා කෙරෙහි සැක කිරීම, 5. සත්වයන්ගේ අතීතය කෙරෙහිද, 6. අනාගතය කෙරෙහිද, 7. අතීත හා අනාගත දෙක කෙරෙහිද, 8. පටිච්ච සමුප්පාදය කෙරෙහි සැක කිරීම විචිකිච්ඡාවයි. මෙම විචිකිච්ඡාව කාන්තාරයක ගමනක් වැනිය. සොරුන් විසින් පැහැර ගත් සලකුණු දක්නට ලැබීම, සුළු ශබ්දයකින්ද තැති ගැනීම, ක්ෂේම භූමියක් හමුවේද යන සැකය ඇතිවීම කාන්තාරයෙහිදී වේ. බුදුරදුන්ගේ පටන් සියලු දේ සැක කරන්නට ශ්‍රද්ධාවක් හෝ මාර්ගඵලාවබෝධයක් හෝ ඇති නොවේ. යෝනිසෝ මනසිකාරය නිසා විචිකිච්ඡාව ප්‍රහාණය වෙයි.

ඒ සඳහා උපයෝගී කරගත හැකි කරුණු හයක් ඇත. ධර්මය පෙළ සහ අරුත් වශයෙන් ඉගෙන ගැනීම, රත්නත්‍රය කෙරෙහි කරුණු විමසා දැන ගැනීම, විනයෙහි ප්‍රගුණ වීම, රත්නත්‍රය කෙරෙහි ශ්‍රද්ධාව දියුණු කරගැනීම, ශ්‍රද්ධාවන්ත මිත්‍රයන් ආශ්‍රය කිරීම, නිතරම තෙරුවන් ගුණ මිශ්‍ර ධර්ම කතා කිරීම සහ ඇසීම වශයෙනි.

සෝවාන් මාර්ග ඥානයෙන් විචිකිච්ඡාව සහමුලින්ම ප්‍රහීන වේ. බෞද්ධ ප්‍රතිපදාවන් අනුව ගමන් කරන බුද්ධ ශ්‍රාවකයන් වන අපිද මේ අකුසල චෛතසික ධර්මයන් ප්‍රහීන කොට සෝවාන් ආදී මාර්ගඵල පිළිවෙළින් උතුම් නිවන් සුව අවබෝධ කරගන්නට අද වැනි වෙසක් පුන් පොහෝ දිනක අදිටන් කරගනිමු.

**ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරවාසී**
**පූජ්‍ය මලන්ගමුවේ සුනෙත්ත හිමි**



# බුදුන්වහන්සේලා පිට දුන් බෝධි වෘක්ෂයන්

1. තණ්හංකර බුදුන් වහන්සේ - රුක්අත්තන
2. මේධංකර බුදුන් වහන්සේ - කැල
3. සරණංකර බුදුන් වහන්සේ - පලොල්
4. දීපංකර බුදුන් වහන්සේ - පලොල්
5. කොණ්ඩඤ්ඤ බුදුන් වහන්සේ - සල්
6. මංගල බුදුන් වහන්සේ - නා
7. සුමන බුදුන් වහන්සේ - නා
8. රේවත බුදුන් වහන්සේ - නා
9. සෝභිත බුදුන් වහන්සේ - නා
10. අනෝමදස්සි බුදුන් වහන්සේ - කුඹුක්
11. පදුම බුදුන් වහන්සේ - මහ මුරුත
12. නාරද බුදුන් වහන්සේ - මහ මුරුත
13. පදු මුත්තර බුදුන් වහන්සේ - සල්
14. සුමේධ බුදුන් වහන්සේ - බක්මී
15. සුජාත බුදුන් වහන්සේ - හුණ
16. පියදස්සි බුදුන් වහන්සේ - කුඹුක්
17. අත්ථදස්සි බුදුන් වහන්සේ - සපු
18. ධම්මදස්සි බුදුන් වහන්සේ - රත්කරව්
19. සිද්ධත්ථ බුදුන් වහන්සේ - කිණිහිර
20. තිස්ස බුදුන් වහන්සේ - ගම්මාලු
21. ඵුස්ස බුදුන් වහන්සේ - නෙල්ලි
22. විපස්සි බුදුන් වහන්සේ - පලොල්
23. සිඛි බුදුන් වහන්සේ - ඇටඹ
24. වෙස්සභූ බුදුන් වහන්සේ - සල්
25. කකුසඳ බුදුන් වහන්සේ - මහුල්මාර
26. කෝණාගම බුදුන් වහන්සේ - දිඹුල
27. කස්සප බුදුන් වහන්සේ - නුග
28. ගෞතම බුදුන් වහන්සේ - ඇසතු



# මන්ත්‍ර බලයෙන් කෝටිපතියන් වශීකර ගන්න බැරි ඇයි ?

රත්මලාන ධර්ම පර්යේෂණාලයේ අධ්‍යක්ෂ පූජ්‍ය හෑගොඩ විපස්සී හිමියෝ අවධාරණය කරති



විද්‍යාව අතින් කොතරම් දියුණු යුගයක අපි ජීවත් වුවත් මිථ්‍යාව පසුපස යන්නන්ගේ හා එය වපුරන්නන්ගෙන් අඩුවක් නැති යුගයක් බවට වර්තමානය පත්ව තිබේ. මිනිසුන් අවිද්‍යාවෙන්, මිථ්‍යාවෙන් අන්ධභාවයට පත්ව ඇත්තේ ඒ මත්තේම කාලය, ශ්‍රමය, ධනය මෙන්ම තමන්ගේ ජීවිතයද අඩුලෙන් අඩුලට පත්කර ගනිමිනි. ඒ අනුව තමන් මුහුණපාන ගැටලු අර්බුද හමුවේ නොපෙනෙන බලවේග යන්නෙන් මිදීම පැමිණ එකම විසඳුම යැයි අදහන්නෝ එමටය. ඒ අනුව ඔවුහු නොයෙක් යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් හූනියම් ආදී මිථ්‍යාවන් පසුපස යමින් තමන් මුහුණ දෙන ප්‍රශ්නවලට පිළිතුරක් සොයති.

නීච කුල වශී ගුරුකම්, රොඩී කුලයේ අබිරහස් ගුරුකම් ආදිය මගින් තමන් හැර ගිය පෙම්වතා, පෙම්වතිය පැමිණ බිරිඳ හැරයන දෙපතුල ළඟට ගෙන්වා දෙන බවටත් නපුංසක දිනවා දෙන බවටත් සහතික වන ආකාරයේ ප්‍රචාරණයන් කොතෙක් දැයි අමුතුවෙන් සඳහන් කළ යුතු නොවේ. අප සමාජයේම සිටින සැලකිය යුතු පිරිසක් ඒවා පරම සත්‍යය සේ දකිමින් හොර රැගෙන්ම එම මිථ්‍යාවන්ට යොමුවනු දැකිය හැකිය. එවැනි මිථ්‍යාවන් වපුරන්නන්ට පවා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් තුළින් ඒ සා විශාල ප්‍රචාරණයක් සිදුකිරීමට ශක්තිය ලැබී ඇත්තේ එවන් දේට සමාජය තුළින් විශාල ප්‍රතිචාරයක් ලැබෙන නිසාමය.

ඇත්තෙන්ම එලෙස පවසන ආකාරයට යමෙකු වශීකර ගන්නට හෝ හැර ගිය අයෙකු දෙපතුල ළඟට ගෙන්වා ගැනීමට හැකි යම් බලවේගයක් තිබේද?

වශීවීම යනුවෙන් අදහස් කරන්නේ යමෙකු තවත් අයෙකු කෙරෙහි ඇතිකර ගන්නා ඇල්මක්, හැඟීමක් නැත්නම් ආශාවකි. මෙම ඇල්ම, හැඟීම නැත්නම් ආශාව ස්ත්‍රියක හා පුරුෂයෙකු අතරේ හට ගැනීම සාමාන්‍ය දෙයකි. ලොව පැවැත්ම උදෙසා මෙකී ආකර්ෂණය මත හටගන්නා අන්‍යොන්‍ය බැඳීම අත්‍යවශ්‍ය දෙයකි.

බුද්ධ දේශනාවට අනුවද සඳහන්ව ඇත්තේ ස්ත්‍රියක පුරුෂයෙකු උනුන්ගේ රූපයට එකිනෙකාගේ සිත් හාස්පයින්ම අල්ලා ගන්නා බවත් හඬ , ආඝ්‍රාණය, ස්පර්ශය ආදී සියල්ල මගින් මෙකී ආකර්ෂණය හට ගන්නා බවත්ය.

මේ ආකාරයට ස්ත්‍රියක හා පුරුෂයෙකු අතර හටගන්නා ආකර්ෂණය නැත්නම් එකිනෙකාට වශී වීම මනුෂ්‍ය ලෝකයට පමණක් සීමා වූවක් නොවේ. සත්ව ලෝකයේ සිටිනා සතුන් අතරේද දෙව්ලොව දෙවියන් හා දෙවඟනන් අතරේ ද පවතින්නකි. බුද්ධ දේශනාවට අනුව එවැනි හැඟීම් නැත්තේ ප්‍රේත ලෝකයේ පමණකැයි පැවැසේ.

මේ ආකාරයේ මිනිස් හැඟීම් විටෙක මිනිසාගේ දුර්වලතාවයකි. එය එසේ වුවද උත්තරීතර වන්නේ එම හැඟීම් පාලනය කර ගැනීමය. හිරිඔත්තප්ප ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළ චෛතසිකයන් දෙක පවට ඇති බිය වීම හා ලැජ්ජාව නැත්නම් හිරිඔත්තප්පය මිනිස් හැඟීම් පාලනයකින් යුතුව පවත්වා ගෙන යාමට ඉවහල් වේ. අද සමාජයේ පවට ඇති බිය හා ලැජ්ජාව තුරන්ව ගොස් තිබීම මිනිස් සිත පාලනයකින් තොරව අයාලේ යාමට හේතු වී තිබේ.

මිනිස් හැඟීම යන මිනිසාගේ දුර්වලතාවය තවත් පැත්තකින් උපයෝගිකරගන්නා වශී ගුරුකම් කරනවා යැයි පවසන්නන් මානසිකව ඇදවැටී දුර්වලව සිටින්නන්ගෙන් උපරිම ප්‍රයෝජන ගනිති.

මුදල් සුරා කෑමෙන් පමණක් නොනැවතී පවසින දුර්වල මානසිකත්වය දැඩිමිනා කර ගනිමින් අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම උපරිමයෙන් සිදුකර ගනිති. කුමන මානසික තත්ත්වයක් මත වුවද වශී ගුරුකම් යන්ත්‍ර මන්ත්‍ර ගුරු හූනියම් ආදිය කර දෙනවා යැයි පවසන වංචනිකයන්ට හසුවන්නන් තරුණයෝ මිනිසුන් බවද නිගාවකි.

උනුන් කෙරෙහි පෙර කී ආකාරයේ හැඟීමක් නැති විට කාන්තාවක හා පුරුෂයෙකු අතරේ ආකර්ෂණයක් ඇති වන්නේ කෙසේද?

එක පාර්ශ්වික හටගත් ආකර්ෂණයක් හේතුවෙන් අනෙක් පාර්ශ්වය තමන් වෙත වශී කරවා ගැනීම පෙර කී ආකාරයේ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වලින් කළ හැකි දෙයක් නොවේ. නමුත් පෙර කී සිද්ධි හේතුවකින් තොරව වුවද කාලයක් පුරා තමන් පිළිබඳව සිතමින් පසුවන අයෙකු පිළිබඳ උපදින අනුකම්පාව මත පසුකාලීනව යම් කැමැත්තක් ඇතිවීමටද බැරිකමක් නැත.

වශී ගුරුකම් පවා කර ගනිමින් තම උත්සාහය අත් නොහරිමින් යම් කාන්තාවක හෝ පුරුෂයෙකු පිළිබඳ සිතමින් ජීවත් වන අයෙකුගේ එම අදහස යම් දිනයක ඉටුවීමටද බැරි නැත. එවැනි විටෙක තමන්ගේ බලාපොරොත්තුව ඉටු වූයේ වශී ගුරුකම ඵල දැරීමක් ලෙස යැයි විශ්වාස කිරීමටද පෙළඹිය හැකිය.

සැමියෙකු හෝ බිරිඳක් එකිනෙකා හැරයාම ප්‍රශ්නයක් නිරාකරණය වනතුරු නැත්නම් කෝපය සංසිඳෙන තුරු පමණක් පැවැතීම බොහෝ විට සිදුවන්නකි. ඒ අයට නැවත ගෙන්වා ගැනීමට වශී ගුරුකම් කළද නොකළද ඔවුන්ගේ පැමිණීම බොහෝ විට සිදුවන්නකි. එසේම අයෙකු වශීකරවා ගැනීමට හැකි ශාස්ත්‍රයක් දන්නා අය ද බොහෝ දුක් මහන්සි වී ප්‍රවත්පත් දැන්වීම්වලට මුදල් වැය කරමින් එම සේවාව වෙනත් අයට ලබා දීමට වෙහෙසෙන අපූරු දැකිය හැකිය. එවන් අය එතරම් වෙහෙස මහන්සි නොවී තමන්ගේ වශී මන්ත්‍ර බලයෙන් කෝටිපති ව්‍යාපාරිකයෙකු වශී කරවා නොගන්නේ ඇයිදැයි ගැටලුවකි.

**හිච්චන් ගුණසේකර**

"යකඩයෙන් හැදුනු මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

# දළදා වරුණ

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාළිගාව
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## වෙසක් අදිටන

[illegible]



# සම්බුද්ධ පරිනිර්වාණය පෙළ ගැසුණු හැටි!

[illegible]

1. ක්ලේශ පරිනිර්වාණය
2. ආයු (සංස්කාර) පරිනිර්වාණය
3. ස්කන්ධ පරිනිර්වාණය
4. ධාතු පරිනිර්වාණය වශයෙනි.

[illegible]

### ක්ලේශ පරිනිර්වාණය

[illegible]

### ආයු (සංස්කාර) පරිනිර්වාණය

[illegible]

### ස්කන්ධ පරිනිර්වාණය

[illegible]

### ධාතු පරිනිර්වාණය


[illegible]

කොළඹ නාලන්ද විද්‍යාලයේ ප්‍රධානාචාර්ය
පූජ්‍ය ලුණුගම්වෙහෙරේ සුනන්ද හිමි

"අසච්ලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ" - (ධම්ම පදයේ 3 වන ගාථාව)




# බුදු සිරිපා පහස ලද සමනොළ ගිර



පුරිය වසරේ උඳුවප් පෝයෙන් ආරම්භ වූ සිරිපා සමය මෙම වෙසක් පුන් පොහෝ දිනයෙන් නිමාවට පත්වේ. මේ කාලය තුළ සිරිපා කරුණා කළ සැදැහැවත් ජනතාව ලක්ෂ ගණනකි. එය හරියටම ගණන් මිණුම් ඇතිව ප්‍රකාශ කරන්නට අසීරුය. මෙම ලක්ෂ සංඛ්‍යාත පිරිස අතරේ බෞද්ධයින්ට අමතරව වෙනත් ආගම් අදහන හා වෙනත් ජාතීන් නියෝජනය කරන පිරිසද සිටි බව අප අමතක නොකළ යුතුය. ඒ සැම කෙනෙකුම සිරිපා ශිඛරය තරණය කළේ අපමණ ශ්‍රද්ධා භක්තියෙන් යුතුව විසින් ඉතා වැදගත් කරුණකි.

ශ්‍රී පාද අඩවිය තරම් සොබාදහමේ අපූරු නිර්මාණයක් නැති තරම්ය. එය ශ්‍රී ලංකා මිහිතලයේ අභිප්‍රජනීය චරිතා සම්පතක් ලෙස බට සිටී. සමන්තකූට නැත්නම් සමනොළගිර කරුණා කිරීම තුළින් ලබාගත හැකි සතුට, විනෝදය හා භක්තිය අන් කවර වන්දනා ගමනකින්වත් ලබාගත නොහැකි බව මගේ අදහසය. අතිශය සුන්දර මනස්කාන්ත පරිසරයක් තුළ පාද චාරිකාවක් ලෙසින් නිර්මිත මෙම වන්දනා ගමන ඇත අතීතයේ සිටම අපේ රටවැසියාට දයාව, කරුණාව, මෛත්‍රිය හා සාමූහිකත්වය ආදී මානව ගුණ දහම් වර්ධනය කරගැනීමට අතිශයින් ඉවහල් වූ චාරිකාවක්ම විය.

'සිරිපා කරුණා කිරීම' හා බැඳුණු සිරිත් විරිත් සම්ප්‍රදායන් රැසකි. 'දීප වංශයේ' සහ 'සමන්තකූට වර්ණනාව' යන ග්‍රන්ථයන්හි සිරිපා වන්දනාවේ ඇති ශ්‍රේෂ්ඨත්වය ඉතා හැඩිමට විවරණය වේ. ගෞතම බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් අටවැනි වර්ෂයේ අද වැනි වෙසක් පුන් පොහෝ දිනයක තෙවැනි වරටත් ලක්දිවට වැඩම කළ සේක. මණිඅක්ඛිත නාරජුගේ ආරාධනයෙන් කැලණි පුදබිමට වැඩි බුදුරජුන් සුමන සමන් දිව්‍ය රාජයාගේ ආරාධනයෙන් සමනල ගිරි මුදුනේ ශ්‍රී පාද පටනක තැබූ බව පෙරදිගසික බෞද්ධ මූලාශ්‍රවල සඳහන් වේ. ඒ අනුව සිරිපා පුද බිම බුදු සිරිපා පහස ලද උත්තම බිම් පිහිටියි.

බුදුරජාණන් වහන්සේ දන් වැළඳූ පසුවද, උන්වහන්සේගේ පිය සටහන තැබූ ගලටද සිටුවන් බෝරුකටද වැදීමෙන් මිනිසාගේ දුක් නැති කොට නිවන් සැප ලබා ගනිමිනි. මේ බව 'බුදුගුණ අලංකාරයේ' දක්වෙන්නේ මෙලෙසිනි.

"දන් වැළඳූ පද,
උන් පදලැහැති පාණද
උන් සිට දුන් රුකද
බුදු මෙසේ සැප ලබති දුක් සිඳ

එමෙන් පුදවන්දයි
සෙක දෙන්ට පිළිවන්දයි
නොකියව තුමන්දයි
හඬා පද පිරිතුරු වන්දයි"
(බුදුගුණ අලංකාරය)

නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය

බුදුරජුන් සිරි පුදේශය සා තබන ලද සිරිපා සටහන් අතරින් අදට ඉතිරිව ඇත්තේ සමනොළගිර සිරිපා සටහන පමණක් වීමද ආශ්චර්යයකි.

ඈත රාජ ඉතිහාසය දෙසට එබී බලද්දී සිරිපා පුදබිම ආරක්ෂා කරගන්නට උර දුන් රජුන් අතර වලගම්බා, පස්වෙනි මිහිඳු රජු, පළමුවෙනි විජයබාහු සහ නිශ්ශංකමල්ල රජු හා කීර්ති ශ්‍රී රාජසිංහ වෙසෙසින් කැපී පෙනේ. මේ බව අභියමුව සිලා ලිපිය එක් සාක්ෂියක් පමණි.

නිශ්ශංකමල්ල රජු මෙම පිත්බිම ගයා සිටුවීම සඳහා විශාල වැඩ කොටසක් ඉටුකොට තිබේ. වන්දනාමානකරුවන්ගේ පහසුව සඳහා රජු විසින් ගම්වරද පූජා කොට ඇත්තේය. විජයබාහු රජු විසින් සිරිපා කරුණා කරනු පිණිස ගල් පඩිපෙළවල් 700ක් කරවා තිබේ.

එද අපේ ශ්‍රී රාහුල හිමියන් සැලලිහිණි සංදේශ කාව්‍යය රචනා කරමින් සමනොළ හිරේ අසිරිය වර්ණනා කළේ මෙසේය.

"පුරදද සමන් සමහින් පුරගන
පැහැනද මිදුරා පරසතු මල්
හර පුද වඩිනා රැදී මුනිසිරිපා
සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙන

වීසර
විසර
තබර
හිර"

හංස සංදේශ කවියාද සමන්හිර දුටු අයුරු ඉතා මනරම්ය.

"සමනළ මුදුන සිරිපද පසින
නිසසල සම සගන ගෙන වඩින
පැහැ දුලා සුනිල් මැණිකෙන් කළ මග
මහදෙළ පිරෙයි ගඟ සිරිසර දුට

මතුලට
මුනිදුට
ලෙසට
කොසට"

ගිරා සංදේශය රචනා කළ කවියාගේ ඇසට සමනළ හිර හසුවූ අන්දමද ඉතා අපූරුය. කවිත්වයේ මනරම් බව පසක් කරමින් කවියා සමනොළ පර්වතය දෙස බලන අයුරු සිත බන්දන සුළුය.

"ලක කොමළඟ සමනොළ ගිරි හිසින්
නළ මහරඟ මලිපිය මල් දමින්
වරලස රග පෙණවැලි හැලිසියෙන්
දිළිසෙන ගඟ ළඟ වැද කරු හිමින්

ගොනා
පුනා
ඉසා
ගනා"

ඇත්තෙන්ම සිරිපා අඩවියේ දක්නට ඇති සොබාසිරියාව හා චමත්කාරය අපේ සංදේශ කවියන් දුටු අයුරු මහස්කාන්තය. ඒ පැම කවියෙන්ම පළකළ නිසග කවි ශක්තිය ඔවුන්ගේ නිර්මාණ පරිකල්පනයට කදිම උදාහරණයක් වේ.


එද අප රටේ සිටි ජනතාව සිරිපා වන්දනාවට සැරසෙන්නේ බොහෝ කල් තියාය. ඒ සඳහා ඔවුන් හිතේ සංවර කරගැනීමටද පුහුණුව වූහ. වාචික සංවරය මෙන්ම කායික පවිත්‍රතාවය ගැනද ඔවුහු බෙහෙවින් ප්‍රවේශම් වූ අතර ඒ සඳහා කළ යුතු වතාවත් නොඅඩුව ඉටු කළහ. එහෙත් වර්තමානයේ සිරිපා පුදබිම වන්දනාමාන කරන්නට යන බොහෝ දෙනෙකු තුළ එම කායික හා මානසික සංවරය නැතිකම අවාසනාවකි. සමහරු මෙය විනෝදස්වාදය සඳහාම යොදාගෙන තිබෙන බවක් පෙනේ. සංගීතය හා මත්පැන් ඔවුනට නැතිවම බැරිය. මෙම අසතුටුදායක තත්ත්වයට වැටකොටු බැඳීම සඳහා අද පොලිසිය හා ආරක්ෂක රැකවල් යොදන්නට සිදුවී තිබීම ඇත්තෙන්ම කනගාටුදායකය. මෙවැනි වන්දනීය ගමනක සතුට හා හක්තිය හා සුන්දරත්වය රැදී පවතින්නේ සංගීතය හා මත් බෝතලය මත නොවේ. එබඳු පරම රමණීය චිත්ත ප්‍රීතියක් උදාකරගත හැක්කේ ආගමට දහමට බරවූ සංවර සිතකිනි. කෙලෙස්වලින් විනිර්මුක්ත වූ දැසකිනි. එකල සිරිපා ගමන පැතපී තිබුණේ මානව සබඳතා තහවුරු කරගන්නා සුහද චාරිකාවක් ලෙසිනි. සැම කණ්ඩායමක් සඳහාම නායකයකු සිටියේය. 'නඩේගුරා' ලෙසින් හැඳින්වූ ඔහු බොහෝ ඇසූ පිරූකම් හා අත්දැකීම් ඇති මැදිවියේ පුද්ගලයකු විය. කණ්ඩායමේ සියලු දෙනාම ඔහුගේ බසට අවනත වූහ. ඔහුගේ උපදෙස්වලට ගරු කළහ. අද වන විට මේ තත්ත්වය බොහෝ දුරට වෙනස් වී තිබේ. අද සිරිපා කරුණා කරන්නට යන බොහෝ කණ්ඩායම්වලට 'නඩේගුරෙක්' නැත.


එද 'නඩේගුරුගේ' භූමිකාව කළ නැතැත්තා ආගම, දහම හොඳින් දත උසස් ජීවිතයෙහි අත්දැකීම් බහුල පුද්ගලයකු විය. එමෙන් පුරාණ සංවරය හා හික්මීම රඳවා ගන්නට ඔහු සමත් විය. ඒ සඳහා භාවිත කළ සන්නිවේදන ජාලාව අපූරුය. එය මානව දයාවෙන් හා කරුණාවෙන් පිරිපුන් එකක් වීමද කැපී පෙනිණ. එද දීර්ඝ දුෂ්කර ගිරිතරණය අද තරම් පහසු නොවිය. එම නිසා ගමනේ අතරමග විවේක ගන්නට වන්දනාකරුවන්ට සිදුවිය. එම විවේක ගැන්වීම සඳහාද විවිධ චාරිත්‍ර වාරිත්‍ර ඉටුකිරීමට ඔවුහු වගබලා ගත්තා පමණක් නොව සාමූහිකව එම චාරිත්‍ර වාරිත්‍ර ක්‍රියාවටද නැංවූහ.

"ගෙත්තම්පාන, හැරමිටිපාන, ඇහැලකඳුර, සීතගඟුල, ධර්මරාජගල, මහගිරිදඹ, භූපා කපොල්ල, දෙබලාවම්බගේ පහන" ආදී ස්ථාන සමනල කන්ද තරණය කරන කොට අතරමගදී හමුවන සුවිශේෂ ස්ථානයන්ය. මෙහි ටික වේලාවක් රැදී සිට වත් පිළිවෙත් ඉටුකොට ගිරිපාහිර තරණය කිරීම ඇත්තෙන්ම ජීවිතයට කිසිදු අමතක නොවන අති සුන්දර අත්දැකීමකි.

සිරිපා මළුව වන්දනාමානකරුවන්ගෙන් පිරී ඉතිරී යන්නේ හිමිදිරියාමයටය. ඊට හේතුව බොහෝ දෙනෙක් 'ඉර සේවය' නැරඹීමට එන්නේ උදේ පාන්දරට බැවිනි. කෙතරම් විශාල පිරිසක් පැමිණියද සිරිපා මළුව ඒ සියල්ලන්ටම ප්‍රමාණවත් විශාලත්වය දනවන කරුණකි.

**සිව්වත් ගුණසේකර**






# සැනසුම ඇත්තේ කොහිද ?

මෙලොව හ විදියට ජීවත් වෙන්න ගියත් සැනසීමක් ලැබෙන්නේ නැ. එක ගැටලුවක් ඉවර වෙනකොට තවත් එකක්... වශයෙන් නැමදුම ගැටලු වශයෙන් අද බොහෝ දෙනා මැසිවිලි වදන් පවසන බව පෙනේ. දිනක් මධ්‍යම රාත්‍රියේ එක්තරා දෙවියෙකු බුදුරදුන් වෙත පැමිණ "අනේ බුදුහාමුදුරුවනේ, ඇතුළතත් අවුල්, පිටත් අවුල්. මේවා විසඳා ගන්නේ කොහොමද?" විමසූ බව සංයුක්ත නිකායේ දේවතා සංයුක්තයෙහි සඳහන් වේ. මේ සිදුවීම සිහියට ගන්නා සැම කෙනෙකුටම පැහැදිලි වන්නේ අප අතර පමණක් නොව ලෝකයේ සැම තැනකම ගැටලුවලින් පිරී ඇති බවයි. මේ අන්දමට මුහුණ පාන්නට සිදුවන සියලු ගැටලු විසඳා ගැනීමට අපට නොහැකි වුවත් අප හරිහැටි බුද්ධිමත්ව ජීවත් වුවහොත් සැහෙන දුරට ඒවායින් මිදී තෘප්තිමත්, සතුටුදායක ජීවිතයක් ගත කිරීමට පුළුවන්කම ලැබෙනු ඇත.

පොදුවේ සලකන විට ලොවෙහිම පවතින ප්‍රශ්න අතුරෙන් ආර්ථික ගැටලුවලට ප්‍රමුඛස්ථානය හිමිවේ. **සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා** යනුවෙන් සියලු සත්වයන්ටම පොදුවේ එකම ප්‍රශ්නය ඔවුන්ට අවශ්‍ය ආහාර ලබාගැනීමයි. බොහෝ දෙනකු සිතන අන්දමට ඔවුන් අවශ්‍ය ආහාර පමණක් නොව ඇස්, කන්, නාස ආදී ඉන්ද්‍රියයන්ට අවශ්‍ය රූප, ශබ්ද, ගන්ධ ආදී ආහාර ලබාගැනීමට ලොබින සැම දෙනාම කැමැති වෙති. ගේ දොර, ඇඳුම් පැළඳුම්, යාන වාහන ආදිය අවශ්‍ය වන්නේද ශරීරය පිනවීම සඳහාය.

බලගතු ප්‍රශ්න ඇති වන්නේ උදරය තුළය. ඒ නිසාම සැම දෙනාටම ඒ ගින්න නිවීමට ආහාර අවශ්‍යය. එහෙත් අද ලෝකයේ නිෂ්පාදනය කරන ආහාරවලින් 3/4 භුක්ති විඳිනුයේ ලෝවැසියන්ගෙන් 1/4 පමණ සුළු පිරිසක් විසිනි. එය තවත් විදියකින් කියතොත් ලෝක ජනගහනයෙන් 3/4කට ජීවත් වීම සඳහා ලැබෙනුයේ නිෂ්පාදිත ආහාරයන්ගෙන් 1/4 පමණකි. මේ නිසා සිදුවී ඇති කණගාටුදායක තත්ත්වය නම් වැඩි පිරිසක් අවශ්‍ය ආහාර අඩුකම නිසා මන්දපෝෂණයෙන් පෙළෙන අතර, තවත් සැලකිය යුතු පිරිසක් ඉතා උසස් පෝෂ්‍යදායක ආහාර ගැනීම හේතු කොටගෙන අධිපෝෂණයෙන් පීඩා විඳිති. මේ අන්ත දෙකම බලගතු සමාජ ගැටලුවකි. රටක යුද කැරලි, කෝලාහල පැන නැගීම කෙරෙහි මේ අයහපත් ආහාර ද්‍රව්‍ය පරිහරණය හේතු වේ. ඒ සමග අවශ්‍යතා සපුරා ගැනීම පිණිස මුදල් සම්පත් නොලැබීමද ගැටලුවකි. 1971 අප රටෙහි ඇතිවූ තරුණ අරගලය පිළිබඳව පරීක්ෂා කළ කොමිෂන් වාර්තාවෙහි පෙන්වා දී ඇත්තේ උගත් තරුණයන්ට ජීවිතය මැනවින් පවත්වාගෙන යාමට අවශ්‍ය රැකියාවන් නොමැතිවීම එම අරගලයට හේතුවක් වූ බවයි.

අද මුළු ලෝකයම ගෝලීයකරණයට ලක්ව ගමන් කරන බව පැහැදිලිය. මේ නිසා විවිධ දේ නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලා දියුණු මහාමාර්ග, විදුලිය, විවිධ රැකියා වැනි දේ සීඝ්‍රයෙන් වැඩිවී ඇති බව පැහැදිලිය. බැලූ බැල්මට රටේ දියුණුවේ ලක්ෂණ වශයෙන් මේවා සැලකිය හැකි වුවත් ඒ තුළින් පැන නැගී ඇති ගැටලු රාශියකි. එද වැඩි පිරිසක් ජීවත් වූ ගම්බද ප්‍රදේශයන්හි අද 50%කටත් වඩා අඩු තත්ත්වයක් ඇති වන ලකුණු පහළ වී ඇත. රැකියාවල යෙදීමට ඇති පහසුව නිසා නගරබද සුළු ඉඩම් ප්‍රමාණයන්හි ඉදිකළ කට්ටු නිවාසවල සිය ගණන් පවුල් ජීවත් වෙති. තම නිවසේ බිත්තියෙන් එපිටත සැත්තේ ජීවත් වන මිනිසුන් පිළිබඳව කවර අවබෝධයක් හෝ නැති දහස් සංඛ්‍යාත අය ඒවායේ වෙසෙති. දවසේ වැඩි කාලයක් රැකියාවටත්, මඟ තොටත් ගෙවන සමහරු දූ දරුවන් ගැන හෝ මව්පියන් පිළිබඳව හෝ වෙනත් සමාජ සම්බන්ධතාවක් උදෙසා සතියකට එක පැයක් හෝ වැය නොකරති. රූපවාහිනියත් නින්දත් ආහාර ගැනීමත් එකම සැපය සේ සිතා සමහරු කල් ගත කරති. එහෙත්



මහසින් උසස් යයි කියන මිනිසාට එපමණකින් තෘප්තිමත් විය නොහැක. කුඩා අවධියේ පටන් අධ්‍යාපනය ලැබීමෙන් විශද ඥානය පමණක් නොව යහපත් විනයකින් යුත් සදාචාරාත්මක පැවැත්මක් සැම දෙනා තුළම තිබිය යුතු බව (දදති විනයං) උගතුන්ගේ පිළිගැනීමයි.

සබ්බේ පුථුජ්ජනන් උම්මත්තක යනුවෙන් පුහුදුන් අය උමතු වූවන් සේ ජීවත් වෙතියි බුදුහු පෙන්වා දුන්හ. සිග්මන් ප්‍රොයිඩ් වැනි උගත්තුද එම අදහස පිළිගනිති. මෙයින් අදහස් කරනුයේ සිත්සත් කොටුවකට යවන ආකාරයකින් උමතු බවින් යුක්ත වීම නොව විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා මහත් ආසාවෙන් උම්මත්තකයන් මෙන් ක්‍රියා කරන බවයි. **ඌනෝ ලෝකෝ අතිත්තෝ තණ්හා දාසෝ** යනුවෙන් රට්ඨපාල සූත්‍රයෙහි සඳහන් වන අන්දමට නොසෑහෙන වස්තුවක් තිබුණත් ලෝවැසි බොහෝ දෙනා සෑහීමකට පත් නොවී මුළා වූවන් සේ කටයුතු කරති.

වස්තුව රැස් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ සැප ලැබීම වුවත් අධික ආසාවෙන් ධනය රැස්කිරීමට කටයුතු කරන සමහර අය ලබන සැපතක් ඇති බවක් නොපෙනේ. '**තණ්හාය ජායතී සොකෝ**' යනුවෙන් මේ ආසාව නිසා ශෝකය ඇතිවන බවත් '**තණ්හාය ජායතී භයං**' යනුවෙන් තණ්හාව නිසා බිය හටගන්නා බවත් බුදුහු පෙන්වා දුන්හ. නිසි වේලාවට ආහාර පාන ගැනීමක් හෝ අභිංසක ප්‍රීතියක් ලැබීමට හෝ සෑහෙන විවේකයකින් කල්ගත කිරීමක් හෝ සමහරුන්ට නැත. මේවා තමා විසින්ම නිර්මාණයක් කොට ගන්නා බලවත් ගැටලුය. ධනය රැස්කර ගැනීමේ **අත්ථි සුඛය** ලබාගත යුතු යයි පෙන්වා දුන් බුදුහු ඒ සමග භෝග සුඛයද ලබාගත යුතු බව දක්වූහ. එහෙත් අද බොහෝ අයට නිසි ලෙස ධනය පරිහරණයෙන් ලබන භෝග සුඛයක් නැති තරම්ය. සැලකිය යුතු ධනයක් නැති හිඟන මිනිසෙකුට සුළු දේකින් යැපෙමින් පුදුම තරම් සැහැල්ලු සිතකින් ගසක් හෝ සෙවන ගෙන දෙන වෙනත් තැනකට ගොස් දවල් දොළහට ගොරවමින් නිදාගැනීමේ වාසනාව හිමිකොටගෙන ඇත. අධික ආසාවෙන් ධනය රැස් කරන මිනිසෙකුට දිවා රෑ දෙකෙහිම ඒ වාසනාව නැත. එයින් පෙන්වන්නේ සැපත උදාවන්නේ ඇතිකම නිසා නොව ලද දෙයින් සතුටු වීම නිසා බවය.

අද බොහෝ අය තම ජීවිතය අවුල් කොටගෙන ඇත්තේ යම් යම් පුද්ගලයන් සහ සමාජ අනුකරණයට යාම නිසාය. අතීතයේ ජීවත් වූ අය අවශ්‍ය ධාන්‍ය වර්ග පමණක් නොව එළවළු ආදිය පවා තම කුඩා ගෙවත්තෙන් ලබාගැනීමෙන් සෑහෙන තෘප්තියක් ලබාගත්හ. එහෙත් අද විවිධ මුද්‍රිත හෝ විද්‍යුත් නාලිකා ඔස්සේ ප්‍රචාරය කෙරෙන ආහාර පානයන්ට ඇබ්බැහිවීමේ ප්‍රවණතාවක් දක්නට ඇත.

එපමණක් නොව දිගු කලක් තිස්සේ අපේ ශීතකරණවල මහා ඇති මස්, මාළු, බිත්තර ආදියටද බොහෝ අය හුරුව සිටිති. කිසිදු ඔහන්සියක් නැතිව කට ළඟටම ගෙනත් දෙන තරමට පිළියෙළ කොට ඇති විවිධ වර්ණවත් කෑම වර්ගවලට මහත් සේ ධනය වැය කරති. මේ නිසා බොහෝතරම් හෘදයාබාධ, පක්ෂඝාත, පිළිකා ආදී බලවත් රෝගයන්ට පමණක් නොව මෙතෙක් නොඇසූ අන්දමේ වෛරස් රෝගයන්ට ගොදුරු වී සිටින්ද? මෙවැනි අර්බුදකාරී තත්ත්වයන්ගෙන් මිදීමට ස්වයංපෝෂිත වූත්, සැහැල්ලු වූත් ජීවන මාර්ගයකට එළඹීමට කල්පනා කිරීම වැදගත්ය.

**පූජ්‍ය දිවියාගහ යසස්සි හිමි**

# සිය මස් කපා පිස ගිලන් භික්ෂුවට යැවූ සුප්පියා උපාසිකාව

ශාන්තිනායක ලොව්තුරා බුදුපියාණන් වහන්සේ බරණැස ඉසිපතනාරාමයෙහි වැඩ වාසය කරන කල්හි එම ප්‍රදේශයේ මහත් ශ්‍රද්ධා භක්තියෙන් යුතු නිරන්තර පින් දහම්හි සිත ඇලුණු උපාසක යුවළක් වූහ. ඔවුහු සුප්පියා උපාසක හා සුප්පියා උපාසිකා නමින් ප්‍රසිද්ධය. ඔවුන් නිරන්තරයෙන් ඉසිපතනාරාමයට යමින් සංඝයා වහන්සේලාගේ සුව දුක් විචාරමින් කටයුතු කළහ.

දිනක් ආරාමයෙහි වැඩ වසන්නා වූ සංඝයා වහන්සේ නමක් විරේක බෙහෙතක් වළඳා සිටියහ. ආරාමයට පිවිසි සුප්පියා උපාසිකාව උන්වහන්සේගෙන් සුවදුක් විමසති.

"ස්වාමීන් වහන්ස, ඔබවහන්සේගේ සුව දුක් කෙසේද?"

"උපාසිකාවෙනි, කිවයුත්තක් නම් ඇත. මම විරේක බෙහෙතක් වැළඳීමි. මේ නිසා මට මස් රසය ඇත්තේ නම් ප්‍රයෝජන වෙයි."

"ස්වාමීන් වහන්ස, මම මස් ගෙන එමි" යි ස්වාමීන් වහන්සේට වැඳ නමස්කාර කොට සුප්පියා උපාසිකාව නිවසට ගියාය.

"දාසය, මේ මුදල්, ගෙන වෙළෙඳ පොළට ගොස් මස් රැගෙන එව."

දාසයා වෙළෙඳ පොළට ගියද මස් නොමැතිව හිස් අතින් ආවේය. හේතුව විමසන කල කියැවුණේ එදින සතුන් මැරීම තහනම් කොට තිබූ දිනයක් බවය.

"හරි වැඩේනේ. මස් දීගත නොහැකි වුවහොත් ස්වාමීන් වහන්සේගේ රෝගය උත්සන්න වනු ඇත. සමහර විට උන්වහන්සේ අපවත්වීමටද පුළුවන. මම මස් දෙන බවට පොරොන්දුවකද පිහිටියෙමි. කෙසේ හෝ මස් දිය යුතුමය. පොරොන්දු ඉටු කිරීමද මගේ යුතුකමය" යනාදී සිතිවිලිවලේ නිමග්න වූවාය.

සුප්පියා උපාසිකාව මුළුතැන්ගෙට ගොස් පිහිය අතට ගෙන මම මගේ මස් කොටසක් හෝ දෙමිදි සිතා කලවයෙන් මස් කපා දාසියට දෙමින් මෙම මස් පිස විහාරස්ථානයේ බෙහෙත් වළඳා සිටින ස්වාමීන් වහන්සේට ගෙන ගොස් දෙන ලෙස කීය.

මෙහෙකාරිය සිය කාර්යය කළාය.

ස්වාමීන් වහන්සේ ඒ වැළඳූහ.

මේ අතර සුප්පියා උපාසක තැන ගෙට එනුවේ මෙහෙකාරියගෙන් "කෝ ස්වාමී දුව පෙනෙන්නට නැත්තේ?" යි විචාළහ. එතුමිය ඇතුළු ගෙයි නිදන බව දාසිය කීවාය. ඒ මන්ද යන්නට සුප්පියා උපාසිකාව සියලු තොරතුරු සැමියාට හෙළි කළාය.



සුප්පියා උපාසක තෙමේ ඉසිපතනාරාමයට ගොස් බුදුහිමි හමුවී සිදුවී ඇති සියලු විස්තර පැවසීය.

"භාග්‍යවතුන් වහන්ස, හෙට දින අප නිවසෙහි දානයට මහා සංඝයා වහන්සේ සමග වඩිනු මැනවි."

සුප්පියා උපාසකගේ ආරාධනය පිළිගත් බුදුහිමි මහා සංඝයා පිරිවරා දානයට වැඩියහ.

සුප්පියා උපාසිකාව පෙනෙන්නට නැත.

"උපාසකය, තොපගේ භාර්යාව සුප්පියා උපාසිකාව අද දින පෙනෙන්නට නැතැ, ඒ මන්ද?"

"භාග්‍යවතුන් වහන්ස, සුප්පියා උපාසිකාව අසනීපයෙන් පෙළෙයි. ඇතුළු ගෙයි නිදන්නීය."

සුප්පියා උපාසක තැන සුප්පියා උපාසිකාව කැඳවාගෙන භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට කැඳවාගෙන එයි.

පින් මහිමය බුදුහිමියන් සෙත ගැටෙත්ම සුප්පියා සිරුරේ වේදනාවක් හෝ ගිලන් බවක් හෝ නොවූවා සේම කලවයේ මස් කපාගත් තැන මසින් පිරී සිහිදු වෙනසක් දක්නට නොහැකි අයුරක් විය.

සොම්නස් සිතින්, පවිත්‍ර චේතනාවෙන් අඹු-සැමි දෙපොළ බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ වෙත දන් පිළිගැන්වූහ.


දානය වළඳා භාග්‍යවතුන් වහන්සේ අනුමෙවෙනි බණ වදාළහ. ධර්ම දේශනාව අවසානයේ මහ පිනැති සුප්පියා උපාසිකාව සෝවාන් ඵලයට පත්වූවාය.

පිරිසිදු සිතින් කරනට කුමක්දැයි හම් නැතැයි හැඟුමෙන් දෙන දානය මහත් ඵලය. සංඝයා වහන්සේලාගේ සුවදුක් විචාරමින්, කෙසේ හෝ අවශ්‍ය දෑ ඉටුකරන සුප්පියා උපාසිකාවගේ චරිතය ආදර්ශයක්මය.

ඉසිපතනාරාමයට වැඩි බුදුපියාණෝ විරේක බෙහෙත් වළඳා මස් අවශ්‍යතාවය හැඟවූ ස්වාමීන් වහන්සේට අවවාද කළහ. මිනී මස් නොවළඳන සේ ශික්ෂා පදයක් පැනවූ උන්වහන්සේ නොවිචාරා මස් නොවැළඳිය යුතු යැයිද වදාළහ.

මහත් ශ්‍රද්ධාවෙන්, පවිත්‍ර චේතනාවෙන් දන මහා පින් දහම්හි නියැලී සුප්පියා සිහුව උදාර චරිතයක් ඇත්තියකි. පින්දහම්හි නියැලුණ දුන් මෙබඳු චරිත ගැන දැනගැනුම මහත් ඵලදායී වන්නේය. එය ඔබ සැමටත් එකොබ වීමටද රුකුල් වන්නේය.

ආචාර්ය සිරිපාල මාදුවගේ


26
මච්ඡ
ජාතකයෙන්
හෙළිවන
බෝසතුන්
සියලු
ලෝසතුන්
කෙරෙහි
වැඩ සැලසූ
ආකාරය

දීපංකර බුදුරජාණන්වහන්සේගේ ප්‍රධාන සාරලක්ෂයක් රහතන්වහන්සේට ස්වකීය ජීවිතය පූජා කොට දීපංකර බුදුන් වඩිනා මග මඩ ගොහොරුවෙහි වැතිර සිටිමින් "බුදුරජාණන්වහන්සේ මා පියක් කොට වඩින්වා"යි ප්‍රාර්ථනා කොට නියත විවරණ ලබා, සමතිස් පාරමී ධර්ම සපුරා, ගෞතම නමින් සම්බුද්ධත්වයට පැමිණ කරුණා, මෛත්‍රී, මුදිතාදී ගුණ ධාරාවෙන් සජීව, අජීව හැම වස්තුවක්ම නිවී සැනසීමට පත් කොට වදාළා වූ, අම්බදහම් ආලෝකයෙන් තුන්ලෝසතුන් සිත් පහන් කළා වූ, විතරාගී තිලෝගුරු අප බුදුරජාණන්වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩවසන සමයෙහි, තමන්වහන්සේ විසින් වස්සවන ලද වර්ෂාවක් අරභයා මච්ඡ ජාතක කතාව දේශනා කොට වදාළ සේක.

ඒකල කොසොල් රටට, වැසි නොවැසීම නිසා ගොයම් ආදී සියලු ගස් කොළන් වියළී ගොස්, වැව් පොකුණු විල් ආදිය සිඳී ගියා පමණක් නොව, ජේතවන විහාරයේ දොරටුව සමීපයෙහි වූ ජේතවන පොකුණෙහි පැන් සිඳී ගියේය. පොකුණ ඇතුලේ සිටි මත්ස්‍යයන් හා කැස්බෑවෝ, කපුටන් හා උකුස්සන් ආදී පක්ෂීන්ගේ අනුභවයට ලක්වූහ. සුපුරුදු පරිද්දෙන් සර්වඥයන්වහන්සේ මහාකරුණාවෙන් එදින ලොව දෙස බලා මත්ස්‍යකැස්බෑවන්ට පැමිණියා වූ මේ විපත දැක, අද මා විසින් වැසි වස්සවන්නට වටින්නේයැයි සිතා, පහන් වූ කල්හි සිවුරු පිළි හැඳ පිඬුසිගා යන වේලාවෙහි භික්ෂු සංඝයා පිරිවරා සැවැත්නුවර වැඩම කොට, දන් වළඳා ආපසු සැවැත්නුවරින් දෙව්රම් වෙහෙරට වඩින අතරතුරේ ජේතවන පොකුණෙහි පියගැටපෙළ මත්තේ වැඩ සිට, ආනන්ද තෙරුන්වහන්සේට ජලසාටිකාව ගෙනෙන ලෙස දන්වා වදාළ සේක. එවිට ආනන්ද තෙරුන්වහන්සේ ස්වාමීනි, ජේතවන පොකුණේ පැන් සිඳී ගොස්ය. පතුලේ මඩ පමණක් ඇතැයි පැවසූහ. එවිට බුදුරජාණන්වහන්සේ ආනන්දයනි, සර්වඥයන්වහන්සේගේ ආනුභාව ඉතා මහත්ය. ඒ නිසා ඔබ ජලසාටිකාව ගෙනෙන්නැයි වදාළ සේක. ආනන්ද තෙරුන්වහන්සේ එය යහපතැයි සිතා ජලසාටිකාව ගෙනැවිත් දුන්හ. බුදුරජාණන්වහන්සේ ජලසාටිකාව එක් කෙළවරක් ඇඳ එක් කෙළවරකින් ශරීරය වසාගෙන ජේතවන පොකුණෙන් ජලස්නානය කරමි'යි පියගැටපෙළ මත වැඩසිටි සේක.

එය දිවැසින් දුටු සක්‍රදේවේන්ද්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උණු වී ගියෙන්, සක්‍රදේවේන්ද්‍රයා කාරණය බලා වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයා කැඳවා සර්වඥයන්වහන්සේ ජේතවන පොකුණෙන් පැන් සනහමියි සිතා මුදුන් පියගැටපෙළ මත්තේ වැඩසිටින සේක. වහාම වියළී තියෙන පැතිරී ඇති කොසොල් රටට වර්ෂාව වස්වා වැව් පොකුණු පුරවන්නැයි දැන්වූහ. වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයා එක් වලාවක් ඇඳගෙන මේඝගීතිකා ගායනා කරමින්, නැගෙනහිර සක්වළට මුහුණලා නික්මුණේය. එවිට නැගෙනහිර දිශාභාගයෙහි අහසේ මේඝමණ්ඩලයක් නැගී ගර්ජනා කරමින් විදුලිය ගසමින් ඇදහැලුණු මහවැස්සෙන් කොසොල් රට මහගංවතුරෙන් යටවිය. වසින්නට පටන් ගත් විට ඇසිල්ලකින් ජේතවන පොකුණේ මුදුන් පියගැටපෙළ දක්වා පැන් පිරී ගියේය. එකෙණෙහිම සර්වඥයන්වහන්සේ ජලස්නානය කොට දෙපට සිවුර ඇඳ, පටිබන්ධ පැළඳ, සුගත චීවරයෙන් ඒකාංශ කොට භික්ෂු සංඝයා සමග දෙව්රම් වෙහෙර දක්වා වැඩම කොට, ගඳකිළි මළුවේ පනවන ලද බුද්ධාසනයේ වැඩසිට, ඉන් නැගීසිට මැණික්මය සඳකඩපහන මත්තෙහි වැඩසිට භික්ෂු සංඝයාට අවවාද දී යවා, සුගන්ධ ගන්ධකුටියට ඇතුල්ව සිංහ සෙය්‍යාවෙන් සැතපී වදාළ සේක.

එදින සවස් වේලෙහි දම්සභා මණ්ඩපයේ රැස්ව උන් භික්ෂූන්වහන්සේ, දසබලධාරී වූ බුදුරජාණන්වහන්සේගේ ශාන්ති සම්පත්තියේ බලය බලන්න... විල් පොකුණු වියළී සත්වයන් මියයන්නට පටන් ගත් විට, ඉන් මත්ස්‍යකැස්බෑවන් දුකට පත්වූ විට මහාකරුණාවෙන් ජනයා හා සියලු සතුන් දුකින් මුදවමියි සිතා, ජලසාටිකාව ඇඳ ජේතවන පොකුණේ පියගැට මත්තේ වැඩසිට මද ඇසිල්ලකින් මුළු කොසොල් රට මහවතුරෙන් වැසි වස්වා මහජනයාගේ හා සියලු සතුන්ගේ කායික මානසික දුක් සමනය කළා වේදැයි සාකච්ඡා කරමින් සිටියහ. බුදුරජාණන්වහන්සේ මහණෙනි, මා එතව පෙර තුමිත කථාවකින් යුක්ත වූයේදැයි විමසූ විට, සර්වඥයන්වහන්සේ සියලු සතුන් දුකින් පීඩිත වන්නට පටන් ගත් විට මේ ආත්මයේදී පමණක් නොව පෙර තිරිසන් යෝනියෙහි ඉපිද මත්ස්‍යරාජ කාලයෙහි වැසි වැස්සවූයේවේදැයි අතීත කරුණු ගෙනහැර දක්වා වදාළ සේක.

අතීතයෙහි කොසොල් රට සැවැත්නුවර ජේතවන පොකුණ පිහිටි තැන වැල්කැලයෙන් ගැවසී ගත් එක කඳුරැලියක් තිබිණ. එසමයෙහි මහබෝසතාණෝ මත්ස්‍ය යෝනියෙහි ඉපිද මත්ස්‍ය සමූහයා විසින් පිරිවරා ඒ කඳුරැලියෙහි විසූහ. දැන් පරිද්දෙන්ම එදවස ද ඒ රටට වැසි නොලැබී වැව් පොකුණු ආදිය සිඳී, මත්ස්‍යකැස්බෑවෝ කළල් යට සැඟවී සිටියහ. මහබෝසතාණන්වහන්සේ තමන්ගේ ඥාති සමූහයාට පැමිණි ඒ ව්‍යසනය දැක මොවුන්ට පැමිණි දුක සත්‍යක්‍රියා කොට වැසි වස්වා මරණ දුකින් මුදවනු පිණිස කළු වූ මඩ දෙබෑ කොට පිරා නික්ම, අඳුරු කැටයක් වැනි වූ මහාමත්ස්‍යයා මැනවින් ඔප දමන ලද ලෝහිතාංක මාණික්‍යයක් හා සමාන වූ ඇස්දෙක දල්වා ආකාශය බලා, වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයාට, මම නැයන් නිසා දුකට පත්වෙමි. සිල්වත් වූ මා දුක් විඳිමින් සිටියදී ඔබ කවර කාරණයක් නිසා වැසි නොවස්සන්නේද? මම ස්වජාතිමාංශය කන්නා වූ මත්ස්‍ය යෝනියෙහි ඉපිද කිසි දිනෙක අනෙක් මත්ස්‍යයෙක් නොකෑවෙමි. කිසිම ජීවිතයක් විනාශ නොකෙළෙමි. මේ සත්‍යයේ බලයෙන් වැසි වස්වා මගේ ඥාති සමූහයා දුකින් මුදවන්නැයි වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයාට විධාන කොට පැවසූහ. පින්වත් වැස්ස වලාහක දිව්‍ය පුත්‍ර, ඔබ ගර්ජනා කොට, විදුලිය ගසා, වර්ෂාව වස්වා අප සමූහයා දියෙන් සතුටා ඒ නැයන් සියල්ල මරණින් ශෝකයෙන් ගළවූහ. බුදුරජාණන්වහන්සේ දැන්මතු නොවෙයි, පෙරත් මත්ස්‍ය යෝනියෙහි ඉපිද වැසි වැස්වූ බව දේශනා කොට පූර්වාපර සන්ධි ගළපා මෙම මච්ඡ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි මත්ස්‍ය සමූහයා නම් දැන් බුදු පිරිසය. වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයා නම් ආනන්ද ස්ථවිරයෝය. මත්ස්‍ය රජු නම් දැන් තිලෝගුරු සමයක් සම්බුද්ධ වූ මමම වෙයැයි දක්වා වදාළ සේක.

තිලෝගුරු සම්මා සම්බුදුරජාණන්වහන්සේ බුදු බව ලැබීමෙන් අනතුරුව පමණක් නොව සසර පුරා ඒ ඒ ආත්ම භවයන්හි සියල් ලෝ සතුන් සසර දුකෙන් මුදවනු පිණිස මහාකරුණාවෙන් ලෝසතුනට වැඩ සැලසූ සේක. මච්ඡ ජාතකයෙන් හෙළිවන අපූරු දැන උගෙන අනන්ත වූ බුදුගුණ අතුරෙන් සුවිශේෂ වූ බුදුකරුණා ගුණයෙන් හදවත් තෙමා සතනා ගැනීම මෙලොව පරලොව සැනසීම පිණිසම හේතුවන්නේය.

ජේ. මීගහකුඹුර

# කිරි වෙහෙරින් කිරි වැහුණු ඇසිරිමත් දවස

රුවන්වැලි සෑ රදුන් අසල රාත්‍රී කාලයේ පිරිත් සජ්ඣායනා ඇසෙන බවත් ශ්‍රී මහා බෝ මළුවේ සිට භික්ෂූන් වහන්සේලා සිටි හැටියේ එහා මෙහා පාවී යනු දුටු බවත් විවිධ අවස්ථාවලදී වාර්තා කර ඇත.

මෙවර අලුත් අවුරුදු උදාව යෙදී තිබුණේ බක් මස පුන් පොහෝ දින දිම වීම විශේෂත්වයකි. අවුරුදු උදාවට පෙර සිදුවූ පොහොසත ගෙවන් පුණ්‍ය කාලයේදී ආගමික ස්ථානයකට ගොස් ආගමික වතාවත්හි යෙදීම බෞද්ධයන්ගේ සිරිතයි. කතරගම කිරිවෙහෙර භූමියද ඒ වේලාවට සැදැහැවතුන්ගෙන් අඩුවක් නැති ස්ථානයකි.



කිහිරි යනු කඳුන් වර්ගයේ ශාකයකි. කිහිරි ගසේ පලු සරමින් ශාඛ පැහැතිය. කිහිරි ගස් අදටද කතරගම අවට දක්නට ලැබේ. අතීතයේ බුදුන් දවස කතරගම අවට කිහිරි ගස් බහුල වනයක් වූයේලු. කිහිරි ගස් බහුල බැවින් මේ වනාන්තරය කිහිරි වනාන්තරය ලෙස හැඳින්වූ බවත් එවකට කතරගම මහාසේන නමැති ප්‍රාදේශීය පාලකයකු සිටි බවත් ජනප්‍රවාදයේ එයි. සොළොස්මස්ථාන පිහිටුවීමට බුදුරජාණන්වහන්සේ තුන්වැනි වරට ලක්දිවට වැඩම කළ අවස්ථාවේ මේ කිහිරි වනයේ සමාපත්ති සුවයෙන් වැඩසිටි බවද එහි සඳහන්ය.

බුදුන් දුටු දවසක්කරුවකු ඒ බව පාලකයාට සැලකළ විට ඔහු සෙනඟ පිරිවරා එහි පැමිණ බුදුන්ගෙන් ධර්මය අසා සෝවාන් වූ බවද මේ ජනප්‍රවාදයේ දැක්වේ. සෝවාන් වූ මහාසේන හට බුදුන්වහන්සේ විසින් පූජනීය වස්තුවක් ලෙස හිස පිරිමැද කේශ ධාතු ලබාදුන් බවත් ඒ කේශ ධාතු හා ධර්මය දෙසීමට වැඩි සිටි අසුනත් තැන්පත් කර මහසෙන් රජු චෛත්‍යයක් කරවූ බවත් බෞද්ධයෝ විශ්වාස කරති. මේ කිහිරි වනයේ පිහිටි චෛත්‍යය කිහිරි වෙහෙර වී පසු කලෙක එය කිරිවෙහෙර වී ඇතැයි මතයකි. මේ මතය සනාථ කරවන කතාවක් සංඝරාජ ස්වාමීන් රචිත දිවයෙක නම් ග්‍රන්ථයෙහිද දක්නට ලැබෙයි.

අතීත ජනප්‍රවාදයේ දැක්වෙන්නේ සෝවාන් වූ මහාසේන මරණින් පසු මහාසේන දිව්‍ය රාජයා නමින් තුසිත දෙව්ලොව උපන් බවයි. වරින් වර දෙව් දේවතාවුන් පැමිණ කිරිවෙහෙරට සිරි පූජා පවත්වන බවද ජනප්‍රවාදයේ එන මතයකි.

අලුත් අවුරුදු දිනට පෙර දිනයේ සැබවින වෙඩිබ සිරි අරගන්නෙ සමාධි ආරණ්‍ය සේනාසනයේ වැඩ වාසය කරන බොරැල්ලේ සිරිසුමන හිමියෝ ප්‍රමුඛ පිරිසක් කිරිවෙහෙර පූජා භූමියට පැමිණියහ. ඒ පොහොසත හැටේ වරවල, වසරක අලුත් අවුරුදු දිනට පෙර දින කිරිවෙහෙරට පැමිණ චෛත්‍යය මළුවට වී ආගමික වතාවත්වල නිරත වී පසුදින අලුත් අවුරුදු නැකතට කිරිවෙහෙර සෑ රදුන් අභියස සිරි ඉසිරිවීම සිරිසුමන හිමියන් ප්‍රමුඛ පිරිසගේ සිරිතයි.

අප්‍රේල් මස 13දා රාත්‍රී බිලන්පත පූජාවෙන් අනතුරුව පැමිණ සිටි පිරිසෙන් 20ක් පමණ දෙනා එහි දස සිල් සමාදන් වූහ. ලුම්බිනි පට්ඨාන සඳහා වෙනුවෙන් ධජ 24ක් හා නව අරහාදි බුදුගුණ වෙනුවෙන් ධජ නමයක්ද කිරිවෙහෙර ඇමියේ එල්ලූහ.


ඉන් අනතුරුව සිදුවූයේ බුදුන්වහන්සේගේ ප්‍රාතිහාර්යයක් හා අපූරු සංසිද්ධියක් ඇති පුවිති ප්‍රාතිහාර්ය පට්ඨාන ප්‍රකරණය සජ්ඣායනා කිරීමයි.

එහි විශේෂත්වයක් තිබේ. වේරගොඩ චන්ද්‍රවිමල හාමිමියන් විසින් රචිත පට්ඨාන මහා පකරණ සන්නය නම් ග්‍රන්ථයේ දැක්වෙන්නේ බුද්ධත්වයට පත් සත්වැනි වර්ෂයේ ඇසළ පුන් පොහෝ දිනයේ සැවැත්නුවර ගණ්ඩම්බ නම් වෘක්ෂ මූලයෙහි තීර්ථකයන්ගේ මානය මර්දනය කිරීම පිණිස යමක ප්‍රාතිහාර්යය පා අවසානයේ පෙර බුදුවරයන් වහන්සේලා මෙන් පුන් පියවරකින් තව්තිසා දෙව්ලොවට වැඩම කළ බවයි.

ඉන්පසු පාණ්ඩුකම්බල ශෛලාසනය මත දිව්‍ය ආසනයේ වැඩහිඳ සඳ බුදුරැස් මාලාවක් විහිදුවමින් දස දහසක් සක්වළින් පැමිණි දේව හා බ්‍රහ්ම ගණයා පිරිවරා වැඩ හිඳිමින් මාතෘ දිව්‍ය රාජයා ප්‍රධාන කරගනිමින් දෙව් බඹ පිරිස අභිමුඛ "කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා" ආදී වශයෙන් අභිධර්ම පිටක දේශනය කළ සේක. එහිදී ධම්මසංගණී විභංග ප්‍රකරණය, ධාතුකථා ප්‍රකරණය, පුග්ගල පඤ්ඤත්ති ප්‍රකරණය, කථාවත්ථු ප්‍රකරණය, යමක ප්‍රකරණය යන ප්‍රකරණ දේශනා කර අවසන් වශයෙන් පරම ගම්භීර වූ අනන්ත නය සමන්විතව ප්‍රස්ථාන මහා ප්‍රකරණය දේශනා කළ සේක. මෙය පට්ඨාන මහා ප්‍රකරණය ලෙස හැඳින්වේ.



"මරණාසන්න තත්ත්වයට පත් ලෙඩ්ඩුන්ගේ රෝගාබාධය පිණිස එක දායකයින් හැන, මවුපියන්ගේ හැන, සහෝදරයන් හැන, නෑදෑ ආදී පිරිසකට මතු සෙත් සලසා



අලුත් අවුරුදු උදාවන මොහොතේ මේ දේශනාව කිරිවෙහෙර භූමියේ පිරිත් සජ්ඣායනා කිරීමෙන් අනතුරුව කිරි උතුරුවමින් අලුත් අවුරුදු උදාව සනිටුහන් කිරීමට සියල්ල සූදානම් කෙරිණි. කිරි ඉතිරීමේ නැකත යෙදී තිබුණේ 14දා උදෑසන 10.17ටය. ඉන් විනාඩි 20ට පෙරාතුව 'මහාසමය' සූත්‍රය සජ්ඣායනා කිරීමද ආරම්භ කෙරිණි.

කතරගම කිරි වෙහෙරට බෝධිය දෙසින් පැමිණ ඇතුළු වන ප්‍රධාන දොරටුව ඉදිරිපිට දෙවැනි මළුවේ කිරි ඉතිරවීම සිදුකෙරෙමින් පවතිද්දී බොරැල්ලේ සිරිසුමන හිමියෝ අමුතු දෙයක් දුටහ. ඒ කිරිවෙහෙරේ කොත් කැරැල්ලේ කොතට පහළින් කිරි වැක්කෙමින් තිබෙන බවයි. මෙය සිදුවෙමින් පවතින්නේ පිරිස සහිත මළුවේ කිරි උතුරුවන ස්ථානයට හරියට කෙළින් ඉහළිනි. හිමියන් බලා සිටින දෙස නෙත් යොමු කළ බොහෝ දෙනා මේ ආශ්චර්යය දැක සාධු නාද පැවැත්වූහ. සුදෝ සුදු පැහැති වෙහෙරේ සුදු පැහැති කොත් කැරැල්ලේ පිටත් වර්ණ සුදු පැහැයෙන් යුතු යම් ද්‍රවණයක් වැක්කෙද්දී දෙවියන් කිරි වෙහෙරට කිරි පූජා පවත්වතියි බැතිමත්හු සිතූහ. අද මෙය තවත් ආශ්චර්යවත් සිදුවීමක් බවට පත්ව ඇත.

අප්‍රේල් මස 14දා පැය හතරකට ආසන්න කාලයක් මේ කිරි වැක්කීම සිදුවූ බවත් ඉන්පසු මේ ලිපිය ලියන මුහුත්පතින්ද දින උදය කාලය දක්වාම 14, 15, 16, 17 යන දින හතරේම කිරිවෙහෙරේ කිරි වැක්කීම සිදුවූ බවත් පැවසේ.

කිරිවෙහෙර විහාරාධිපති කොබවක ධම්මින්ද හිමියෝ මෙසේ කීහ.

"මෙය සැබැවින්ම ආශ්චර්යයක්. කිරිවෙහෙර බුදුන්වහන්සේ වැඩම කර සමාපත්ති සුවයෙන් වැඩ හිඳීමෙන් පූජනීයත්වයට පත්වූ සොළොස්මස්ථානවලින් එක් ස්ථානයක්. මෙලෙස කිරි ඉතිරීමක් සිදුවන බව අසන්නට ලැබීමත් සමඟ මම එහි ගොස් බැලුවා. එය මා ඇස් දෙකෙන්ම දුටුවා. ඒ ස්ථානයේ සිටි සිය ගණනක් සැදැහැවතුන් සියලින් දැක සාධු නාද පැවැත්වූයේ මහත් භක්තියකින්. ඒ වගේම දැන් සැම දිනකම මේ ආකාරයෙන් උදය කාලයේ එම වේලාවට ආසන්නව කිරි වැක්කීම දිගින් දිගටම සිදුවනවා. අපි ඇසින් දුටු දේ සත්‍යයක්. මෙහි විද්‍යාත්මක පැහැදිලි කිරීමක් සිදුකළ නොහැකියි. කෙසේ සිදුවනවාද කියා කිව නොහැකි වුවත් බෞද්ධයන් ලෙස අපි විශ්වාස කරනවා යම් ආශ්චර්යයකින් මෙය සිදුවන බව. මෙවැනි සිදුවීමක් 1970 වර්ෂයේදී සිදුව තිබෙන බව දැනගන්නවා."

බොරැල්ලේ සිරිසුමන හිමියෝ මෙසේ කීහ.

"මේ ආකාරයට සුදු පැහැයෙන් වැගිරෙන දෙය විනාඩි 20ක් පමණ මා බලා සිටියා. එය වැගිරෙමින් වියළී ගියා. මුහුත්පතින්ද දක්වාම සිදුවූ බව දැනගත්තා."

ඒ හිමියන් පවසන්නේ ස්වර්ණමය මෙය මෙසේ සිදුවනවා යැයි බුදු දහම අනුව කිව හැකි වුවද විද්‍යාවට අනුව එසේ පැවසිය නොහැකි බවයි.

සජීව විජේවීර

# මෙම පුදබිම කුමක්දැයි නම්කර වටිනා ත්‍යාගයක් හිමිකර ගන්න

මෙහි පහත දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පිහිටි වටිනා පුද බිමක පැරණි ඡායාරූප දෙකකි. එය කුමක්දැයි නම් කොට පිළිතුර තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවන්න. එහි ඔබේ නම හා ලිපිනයද සඳහන් කරන්න. ඔබේ පිළිතුර එවිය යුත්තේ, සංස්කාරක, දළදා වරුණ, දළදා මාළිගය, මාධ්‍ය ඒකකය, මහනුවර යන ලිපිනයටයි.

**(නිවැරදි පිළිතුර එවනු ලබන ජයග්‍රාහී වාසනාවන්තයාට දර්ශනීය ශ්‍රී දළදා පෙරහර සහිත රාමු කරන ලද වටිනා සිත්තමක් පරිත්‍යාග කෙරේ. මෙම වටිනා ත්‍යාගය පිරිනැමීම සඳහා අනුග්‍රහය දක්වන්නේ ප්‍රකට විද්‍යා ලේඛකයකු වන අතුර සී. පෙරේරා මහතා විසිනි. එතුමාගේ ආදරණීය බිරිඳ වන වාලට් බෙනරගම මහත්මියට හා ලෝ වැසි සියලු දෙනාටම පෙත්පතා මෙම ත්‍යාගය පිරිනැමේ.)**

පසුගිය කලාපයේ 'පුදබිම' නිවැරදිව නම්කොට ජයග්‍රහණය ලැබූ වාසනාවන්තයා

**ශු.බී. දිනූෂා සඳමාලි ගුණවර්ධන**
අංක : 01, පොල්ලේගොඩ,
ඇඹිලිපිටිය.


(ඔබේ ත්‍යාගය ලබා ගැනීම සඳහා හැඳුනුම්පත සමඟ ශ්‍රී දළදා මාළිගාවේ මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාලය වෙත පැමිණෙන්න)





පසුගිය කලාපයේ (අප්‍රේල්) ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර:
කැලණි විහාරය

"නිතර අනුන්ගේ දොස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙයි. ඔහු ආශ්‍රව ක්ෂයයෙන් දුරස්ය."



## බුදුගුණ මහිමේ

සංසාරමර ලෝක නාථ සම්බුදු සමිඳේ
තිලෝ තිලක මන රංජිත සුගත මුනින්ඳේ
ඉරා අඳුරු පට නැණ එළි දල්වූ නිතිනේ
වඳිනෙමි ගුණ සිහි කරමින් බුදු ගුණ මහිමේ

පිරූ කල්ප සිය දහසක් පාරමී බලයේ
ලබා උතුම් බෝධි පදවි ඒ ගුණ මහිමේ
යොමා දෙනෙත් කරුණාවෙන් ලෝ දුක් සයුරේ
එවා එගොඩ කළ සේකයි සදහම් පවුරේ

දමා පසෙක අත් නිවනේ මහසත් මවුණු
යොමා සසර කතරට දුක නිවන්න සහනු
අරහං ආදී අනන්ත බුදු ගුණ විහිදූ
සද වඳිමු මෙත් පා යුග සම්බුදු සමිඳූ

කැකිරාවේ රංජනී වික්‍රමසිංහ

## බුදුසිලිලාර

සත් පියුමන් පිපුණිද සල් උයනේ
පාරමී ගුණ බල විහිදලා
තරුණි දිදුලයි ගුවන් ගැබේ
මෙත් සිලිලාරෙන් හද සනහා

නවගුණ නැටිවී අමා දියේ
අනෝනත්ත විල තෙවම වුණා
සිව් බඹ ගුණ ගත දෝත දරා
සිව් සත ලෝසත දහම වුණා

කල්ප කාලයක් පෙරුමන් පුරලා
බුදු බව ලෝ වෙත තිළිණ කලා
යහ මග පාදන දහම් කියාදී
ලෝසත පාපින් මුදවන්නා

- පුලානි කළුආරච්චි



## සිත්මල් යායට වඩින්න

බුදුරුවගල කඳු මුදුනට බණ වැසි
වසිනවා සැමද පෝය දිනේ
පිං විසිරෙන බුදු බණ පාවෙන කොට
පිං සුවඳයි බුදුරුවගල කන්දේ

බුදු සමිඳුනි බණ පදයක් අහගෙන
ඉන්නට ආසයි සැනසිල්ලේ
සිත් තුළ පිං සිතුවිලි ගලනා කල
කොහොමද නැවිල්ලා ඉන්නේ

විසිරෙන බණ පද නූලක අමුණා
පිරිත් නූල් ගෙන බැඳලා අතේ
බුදු සමිඳේ අපෙ සිත් මල් යායට
පිරිත් පැනින් සෙත් පතනු මැනේ

- මිල්ටන් මලවිආරච්චි



## වෙසක් පුන් පොහෝද

සඳුගෙ එළියෙන් ලොවම නැහැවේ
මඳ පවනින් බෝ පත් නැලැවේ
දම් අමා ගඟ ගලාලා
ලොව නිවී සැනැහේ - වෙසක් පුන් පෝද

වෙසක් සඳ යට එළිය පතුරයි
ලොවම එක යායක් වගේ
සිතින් සිත මෙත් මල් පිපෙයි
මුළු ලොවම නෑයින් වගේ

සැලෙයි බෝපත් පිරිත් ස්වරයෙන්
දෙසූ බණ සවනට ඇසේ
පිනිස යහපත ලොවෙහි නම්
බුදුන් යළි වැඩියා වගේ

- සමන්තා දයා මැණිකේ







**77 වැනි ප්‍රහේලිකාව සහ ජයග්‍රාහකයන්
පිළිබඳ තොරතුරු ලබන කලාපයෙන්
බලාපොරොත්තු වන්න**

බොදු පුවත්

# ආරණ්‍ය වංශික සංඝකීර්ති ශ්‍රී සරණංකර සීලානන්ද යන ගෞරව නාම සම්මුතියෙන් පිදුම් ලබති



මහනුවර මල්වතු මහා විහාර පාර්ශ්වයේ යටිනුවර ප්‍රධාන සංඝනායක පදවියට අති ගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මාහිමි විසින් ආරණ්‍ය වංශික සංඝකීර්ති ශ්‍රී සරණංකර සීලානන්ද යන ගෞරව නාම සම්මුතිය සහිතව පත්කරනු ලැබූ කඩුගන්නාව ඉල්ලදෙර ප්‍රධාන පොත්ගුල් විහාරාධිපති ශාස්ත්‍රපති මිවල සෝරත හිමි වෙත ශ්‍රී සන්නස් පත්‍රය මල්වතු පාර්ශ්වයේ ගෞරවනීය මාහිමි විසින් පිළිගැන්වූ අවස්ථාව ඡායාරූපයේ දක්වෙයි. මාහිමිපාණන්ට වම් පසින් මල්වතු පාර්ශ්වයේ අනුනායක නියංගොඩ විජිතසිරි, මහෝපාධ්‍යාය අග්ගමහා පණ්ඩිත අලුත්ගම ධම්මානන්ද යන නාහිමිවරුද වැඩ සිටිති.

# දරුවන්ගේ නැණස පෑදුවාට යටිනුවර සුමන නාහිමියන්ට උපහාර



මහනුවර ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවතේ කීර්ති ශ්‍රී රාජසිංහ පොත්ගුල් විහාරයේ සිරි සමාධි දහම් පාසලේ 38 වැනි තෑගි සහ සහතික පත් ප්‍රදානෝත්සවයේදී තිස් අට වසරක් ප්‍රධානාචාර්යවරයා ලෙස දරුවන්ගේ දහම් දැනුම වර්ධනය කිරීමෙහිලා බෞද්ධ අධ්‍යාපනික සේවයක් ඉටුකළ විහාරාධිපති, ත්‍රිපිටකවේදී, ශාස්ත්‍රපති, යටිනුවර සුමන නාහිමියන් වෙත මධ්‍යම පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා උපහාර පිළිණය ප්‍රදානය කළ අවස්ථාව ඡායාරූපයේ දක්වෙයි. මුලසුනේ උඩමත්තේ නන්ද හිමි වැඩ සිටිති.

ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දෑල මහතා විසින් ධර්ම පොත් තෑගි සඳහා ලබාදීමෙන් දායකත්වය දුන් අතර දියවඩන නිලමේතුමා නියෝජනය කරමින් ශ්‍රී දළදා මාළිගාවේ බෞද්ධ කටයුතු අංශයේ ලේකම් විශ්‍රාමික අධ්‍යාපන අධ්‍යක්ෂ කේ. මීගහකුඹුර මහතා මේ අවස්ථාවට සහභාගි විය.

# දළදා මාලිගාවේ වෙසක් පෙරහරට සමගාමීව මල්වතු අස්ගිරි මහා විහාරයන්හි උපසම්පදා පෙරහර

මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ වෙසක් පෙරහර සහ මල්වතු අස්ගිරිය මහා විහාරයන්හි උපසම්පදා පෙරහර වෙසක් පුර පසළොස්වක පෝද (මැයි 14) චාරිත්‍රානුකූලව පැවැත්වේ. මෙදින මල්වතු අස්ගිරි මහා විහාරයන්හි ආරම්භ කරන උපසම්පදා ප්‍රණෝත්සවය ජූනි මස 12 වැනිදා යෙදෙන පොසොන් පෝය දින තෙක් පැවැත්වේ.

වෙසක් පෝය දින ශ්‍රී දළදා මාළිගාවෙන් පිටත්වන වාහල්කඩ කාර්යයෙන් උපසම්පදා ශීලයෙහි පිහිටුවනු ලබන සාමණේර දෙනම වැඩමවා ගත් උපසම්පදා පෙරහර දෙක මල්වතු අස්ගිරිය මහා විහාරය කරා ළඟාවීමෙන් අනතුරුව සිරිත් පරිදි ශ්‍රී දළදා මාළිගාවේ වෙසක් මහ පෙරහර ශ්‍රී දළදා මාළිගාවේ මහ වාහල්කඩ අභියසයෙන් පිටත්ව මාළිගා චතුරශ්‍රයේ වීදි සංචාරය කෙරේ.

# ශ්‍රී දළදා බැතිමතුන්ට මල් බෙදීම ශ්‍රී පුෂ්පදාන සමිතියෙන්



මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතිය 106 වැනි වතාවටත් ශ්‍රී දළදා මාළිගාවට වෙසක් පෝද පැමිණෙන බැතිමතුන්ට මල් බෙදීම ශ්‍රී දළදා මාළිගාව අභියසදී සිදුකරයි. ශ්‍රී දළදා මාළිගාවට පැමිණෙන සැදැහැවතුන්ට මල් බෙදීම මූලික අරමුණ කරගෙන ආරම්භ කරන ලද මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතිය සෑම පුර පෝ දිනකම මල් බෙදීම අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි. මහනුවර ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවතේ කීර්ති ශ්‍රී රාජසිංහ පොත්ගුල් විහාරයේ අධිපති, අධිකරණ සංඝනායක යටිනුවර සුමන නාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් වෙසක් පිංකමක් පැවැත්වෙන අතර සති පිංකමට සමගාමීව බී. ඩබ්ලිව්. ඒ. අජන්ත කුල දරුවා සසුන් ගත කිරීමද සිදුකෙරේ.

# කහගල ධම්මරක්ඛිත වර්ෂ පූර්ණ පිං පමුණුවන පිංකම මැයි 30-31 දිනවල

අපවත් වී වදාළ මල්වතු මහා විහාර පාර්ශ්වයේ යටිනුවර ප්‍රධාන සංඝනායක කඩුගන්නාව ඉල්ලදෙර ප්‍රධාන පොත්ගුල් විහාරාධිපති කහගල ධම්මරක්ඛිත නාහිමිට පිං අනුමෝදන් කරන වර්ෂ පූර්ණ පිංකම මැයි 30-31 දිනවල ඉල්ලදෙර විහාරයේදී පැවැත්වේ.

මැයි 30 වැනි දින පිරිත් දේශනාවකි. 31 දින මල්වතු අස්ගිරි මහානායක, අනුනායක හිමිවරු ප්‍රධාන ශතාධික මහා සංඝරත්නය විෂයෙහි පිරිනමනු ලබන සපිරිකර සංඝගත දක්ෂිණාවකි.

විහාරාධිපති, යටිනුවර ප්‍රධාන සංඝනායක නාහිමි ප්‍රධාන ශිෂ්‍ය මිවල සෝරත නාහිමි ප්‍රධාන ශිෂ්‍ය පිරිසගේ ප්‍රධානත්වයෙන් හා විහාර කාර්යසාධක සමිතියේ සහභාගිත්වයෙන් පිංකම පැවැත්වේ.

# අමුණුගම ශ්‍රී නිවාස හිමි වෙසක් පෝද වාහල නාග නාමයෙන් උපසම්පදාව ලබති



ඓතිහාසික ශ්‍රී ලංකාතිලක, සොබිතුන්ඩුව මාවෙල, ඇම්බිල්ල, තොටුගොඩැල්ල සහ පුසුල්පිටිය යන රජමහ විහාර අධිපති, මහනුවර මල්වතු මහා විහාරවංශික කාරක සංඝ සභික, අමුණුගම, රජගුරු විපස්සී නායක ස්වාමීන්ද්‍රයන්ගේ ශිෂ්‍ය සිඛය දුනට මහනුවර අස්ගිරිය මහා විහාර මහ පිරිවෙනේ ධර්ම ශාස්ත්‍රය හදාරණ අමුණුගම ශ්‍රී නිවාස සාමණේර නම මැයි මස 14 වැනි දිනට යෙදී ඇති වෙසක් පුර පසළොස්වක පෝ දින වාහලනාග නාමයෙන් මල්වතු මහා විහාරයීය ඓතිහාසික මංගල උපෝසථාගාරයේදී උපසම්පද අධිශීලයෙහි පිහිටුවනු ඇත.

ශ්‍රී දළදා මාලිගාවේ සිට උපසම්පද පෙරහරෙන් පෙව්දින සවස 2.30ට මල්වතු මහා විහාරය කරා වැඩම්මවාගෙන එනු ලබන අමුණුගම ශ්‍රී නිවාස සාමණේර නම සම්ප්‍රදායානුකූලව මල්වතු මහා විහාර පාර්ශ්වයේ අතිගෞරවනීය මහානායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් මංගල උපෝසථාගාරයේදී වාහල නාග නාමයෙන් උපසම්පද සීලයෙහි පිහිටුවනු ඇත. සවස 4.15ට මල්වතු මහා විහාරයේ සිට තොටුගොඩැල්ල රජමහා විහාරය කරා පෙරහරෙන් වැඩම්මවාගෙන එනු ලබන අමුණුගම ශ්‍රී නිවාස හිමියෝ පෙව්දින සවස 6.30ට සිය මංගල ධර්ම දේශනය පවත්වති.

# කටුවන සීලානන්ද හිමි උපසම්පදාව මැයි 21ද



යටිනුවර ගෙතලාත දේරාදෙණිය ඓතිහාසික ගන්නෝරුව රාජමහා විහාරය සහ ගන්නෝරුව උඩබොඩවෙල පුරාණ විහාරාධිපති, මල්වතු මහා විහාරීය විශේෂ කර්මාචාර්ය, යටිනුවර පළාතේ උප ප්‍රධාන අධිකරණ සංඝනායක අම්බන්පොළ විමලානන්ද ධර්මකීර්ති ශ්‍රී සරණංකර සුමංගල නායක හිමියන් සහ පේරාදෙණිය ඒදණ්ඩවල පුරාණ විහාරාධිපති පොල්ගොල්ල සීලවංශ විද්‍යායතන පිරිවෙන් නියෝජ්‍ය පරිවේණාධිපති ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත මාකෙළේ අභයධම්ම හිමියන් ප්‍රිය සිඛය විශිෂ්ටතලාව මයිජත්පොල ශ්‍රී ධර්මවර්ධන පිරිවෙනේ මූලික ධර්ම ශාස්ත්‍රය හදාරා මහනුවර අස්ගිරිය මහා විහාර මහ පිරිවෙනේ සහ පේරාදෙණිය ශ්‍රී නාරායි විද්‍යායතනයෙන් ප්‍රාචීන ප්‍රාරම්භ අධ්‍යාපනය ලැබූ කටුවන සීලානන්ද හිමි නම මැයි 21 වැනි දින මල්වතු මහා විහාරීය උපෝසථාගාරයේදී වාහල නාග නාමයෙන් උපසම්පද සීලයෙහි පිහිටුවනු ඇත. කටුවන සීලානන්ද හිමි පිළිගැනීමේ උත්සවය මැයි 22 සවස 3.30ට පැවැත්වෙන අතර සවස 2.00ට ගන්නෝරුව හේ ශක්ති ආයතනය අසල සිට සීලානන්ද හිමි වැඩම්මා ගත් පෙරහර පිටත් වේ. සීලානන්ද හිමිට ආශිර්වාද පතා පෙන් පිරිත් දේශනය විහාරාධිපති අම්බන්පොළ ශ්‍රී සුමංගල නාහිමි ප්‍රධාන මහා සංඝරත්නය විසින් සවස 5.30ට ගන්නෝරුව රජමහා විහාරයේදී විහාර කාර්යසාධක සමිතියේ මෙහෙයවීමෙන් සිදුකෙරේ.

බෝධි පුවත්

# අනුරපුර ඉදිකෙරෙන වැලිවිට ශ්‍රී අසරණ සරණ සරණංකර සංඝරාජ බෞද්ධ මධ්‍යස්ථානයට මුල්ගල තැබේ





කන්ද උඩරට මහනුවර රාජධානියක්ව පැවැති සමයෙහි ලක්දිව එකද උපසපන් භික්ෂුවකුදු නොමැතිව ශාසනික හා ධර්ම ශාස්ත්‍රීය මහත් පරිහානියක් පැවැති අඳුරු කාලෙක සඳුන යම් පමණකට හෝ එකගත්තේ ගණින්වහන්සේලා විසිනි. මෙසේ ශාසනික ධර්ම ශාස්ත්‍රීය පරිහානියක් පවත්නා අවස්ථාවෙහි තුම්පනේ වැලිවිට කුලතුංග මුදලි කෙනෙකු නිසි මව්කුසින් බිහිව වැඩිවිය පැමිණ සූරියගොඩ මුරුතලාව පිහිටි ශ්‍රී නරේන්ද්‍රාරාම විහාරස්ථානයේදී පැවිදි බව ලැබූ වැලිවිට අසරණ සරණ සරණංකර හෙරණපාණන්වහන්සේ පිණ්ඩපාතයෙන් යැපෙමින් දුක්ගැහැට විඳිමින් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා සිල්වත් සමාගම පිහිටුවා ශාසනාලෝකය ඇතිකිරීමට බලවත් වෙහෙසක් දරන ලදී.

පූජ්‍යපාද භික්ෂූකාමීව ධර්ම ශාස්ත්‍රීය කටයුතුවල නිරත වෙමින් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ කාලයෙහි රජුගේ අනුග්‍රහය නොමඳව ලබා සියම් දේශයට දූතයන් යවා මල්වතු මහාවිහාරයෙහි උපෝසථාගාරයේදී සියම් උපසම්පදාව පිහිටුවා අවසන් සඟරජ හැටියටද පත්විය.


සංඝරාජයාණන් වහන්සේ විසින් සිදුකරන ලද අනුපමේය ධර්ම ශාස්ත්‍රීය සේවය කෙරෙහි කෘතඥතාවේදීත්වය පළකරනු වස් සූරියගොඩ මුරුතලාව පිහිටි ශ්‍රී නරේන්ද්‍රාරාම විහාරස්ථානයෙහි වර්තමාන විහාරාධිපති පූජ්‍ය වෙරළුගස්හින්නේ ධම්මරතන නාහිමියන් මූලිකත්වයෙන් ශ්‍රී අසරණ සරණ සරණංකර සංඝරාජ සමාජ ආර්ථික පදනම පිහිටුවා බලවත් ශාසනික කටයුතු රැසක් ඉටුකරනු ලබයි.

එම ශාසනික කටයුතු වඩාත් ව්‍යාප්තව පවත්වාගෙන යෑම සඳහා අනුරාධපුරය කටුකාලියාව නවනගරය මුල්කොට වැලිවිට ශ්‍රී අසරණ සරණ සංඝරාජ බෞද්ධ මධ්‍යස්ථානය නමින් ආගමික, සාමාජීක, සංවර්ධන සත්කාරක මධ්‍යස්ථානයකට මුල්ගල තැබීම බලවත් කෘතඥතාවේදී ශාසනික කටයුත්තකි.

අනුරාධපුරය අපේ ඉපැරණි ප්‍රථම රාජධානියයි. ලක්දිව බුද්ධාගම ප්‍රතිෂ්ඨාපනය වූ පූජ්‍ය භූමියයි. අනුබුදු මිහිඳු මහරහතන්වහන්සේ වැඩසිටි පූජනීය පින්බිමයි. රජරටින් ආරම්භව බුජ දිවයින පුරා මහත් ශාසනාලෝකයක් පතුරුවාලූ අනුරාධපුරය ඉපැරණි අගනගරය මුල්කොට අවසන් සඟරජ හැටියට සැලකෙන වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජෝත්තමයාණන්වහන්සේගේ අනුස්මරණය කෙරෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම හා එමගින් ධර්ම ශාස්ත්‍රීය සේවාවට හා ජනතා ප්‍රබෝධයට මුලපිරීම බලවත් පුණ්‍ය කර්මයකි. කෘතඥතාවේදී ගුණය දක්වීමකි. ඒ සඳහා රජයේ හා බෞද්ධ ජනතාවගේ පූර්ණ අනුග්‍රහය ඇතිව වැලිවිට සඟරජ අනුස්මරණ මධ්‍යස්ථානයක් ගොඩනැඟීම ඉතා වැදගත් කාර්යයකි.

මෙම විශේෂ ව්‍යාපෘතිය සඳහා මුල්ගල තැබීම මැයි මස 02 වන දින සුබ මුහුර්තියෙන් ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ තැන්පත් ප්‍රදීප් නිලංග දැල මැතිතුමාගේ ප්‍රමුඛත්වයෙන් සිදුකිරීම ශාසනමාමක කාගේත් අභිනන්දනයට හේතුවේ. සුබ මොහොතින් මුල්ගල තැබීමෙන් ඇරඹෙන මෙම පුණ්‍යෝත්සවය සාර්ථකව පවත්වන්නා සේම මෙහි ගොඩනැඟීමට අපේක්ෂිත ගොඩනැගිලි සංකීර්ණය ඉතා ඉක්මනින් නිමකරවා වැලිවිට සඟරජ ශ්‍රී නාමයට ප්‍රයෝජනයක් මවට එය පත්කිරීමට බලවත් උත්සාහයක් දරන පූජ්‍ය වෙරළුගස්හින්නේ ධම්මරතන හිමි ඇතුළු සඟරජ පදනමේ සියලු දෙනාටත්, සුදුසු භූමි භාගයක් වෙන්කොට දී ඊට අනුග්‍රහය දක්වන අතිගරු ජනාධිපතිතුමන්, සංස්කෘතික ඇමැතිතුමන් ඇතුළු රජයේ සියලු මැති ඇමැතිතුමන්ලාටද, බෞද්ධ නායකත්වයේ සංකේතය ලෙස සැලකෙන සෙංකඩගලපුර ශ්‍රී දළදා මන්දිරයේ දියවඩන නිලමේ තනතුර දරන ප්‍රදීප් නිලංග දැල මැතිතුමන්ටද ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

කේ. මීගහකුඹුර



# නිවැරදිව ආනාපාන සති භාවනාව වඩන්නේ මෙහෙමයි

ජීවිතය පවත්වාගෙන යාම සඳහා හුස්ම ගැනීම කළ යුතුය. බොහෝ විට අප සිතන්නේ අපගේ දිවි පැවැත්මට අවශ්‍ය වන්නේ ආහාර පාන පමණක්ය යනුවෙනි. ඒවා ලබා ගැනීමට යම් වෙහෙසක් දැරිය යුතු වෙමු. එහෙත් හුස්ම ගැනීම කිසිදු වියදමක් නොකොට නොමිලයේම කළ හැකිය. හුස්ම ගැනීම අපේ ආර්ථිකයට කිසියම් බලපෑමක් නොකරයි. එබැවින් ඒ පිළිබඳව අවධානය නොකරන බව සිතිය හැකිය. අපි නිද සිටින විටත්, අවදියෙන් සිටින විටත්, හුස්ම ගනිමින්, හෙළමින් සිටින්නෙමු. හුස්ම නොගෙන සිටියහොත් ටික වේලාවකින් මරණයට පත් වෙයි. ආහාර පාන නොගෙන දින කිහිපයක් වුවද සිටිය හැකිය. එහෙත් හුස්ම නොගෙන සිටිය හොත් විනාඩි කිහිපයක් තුළ දී මරණයට පත්විය හැකිය. මෙය අත්හදා බැලීමට උත්සාහ නොකළ යුතුය. ආනාපානය හෙවත් හුස්ම ඉහළට ගැනීමත්, පහළට හෙළීමත් පිළිබඳ සිහිය පිහිටුවා ගැනීම ඉතා වැදගත් වෙයි. එය පුරුදු කිරීම ගැන ඉතා වැටහීමක් ලබා ගත යුතුය. එමගින් ලැබෙන ප්‍රතිඵල සත්‍යය වශයෙන්ම විස්මයජනකය. අපි දිනකට දෙතුන් වරක් ආහාර අනුභව කරන්නෙමු. එනමුත් අපි නිරන්තරව වාතය අනුභව කරමින් සිටින්නෙමු. හුස්ම ගැනීමෙන් සහ පහත හෙළීමෙන් සිදු වන්නේ එම කාර්යයයි. මෙම පුහුණුව වැඩි වැඩියෙන් කිරීම මගින් ලැබිය හැකි ප්‍රතිඵලය වැඩි බවක්, හුස්ම පට පටන් සිදුවී එක වරක් සිටව වැටහෙනු ඇත. ඇතැම් විට හුස්ම වැටීම නැවතුන බවක් හැඟෙනු ඇත. සැබවින්ම මෙහිදී සිදු වන්නේ සමෙහි රෝමකූප තුළින් හුස්ම ගමන් කිරීමය. ඔබ ඒ බව දැනගෙන සිටීම ප්‍රමාණවත්ය.



අපි උපන්දා සිට ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමු. එහෙත් ඒ ගැන අපේ අවධානය ප්‍රමාණවත් පරිදි යොමු වේද? බොහෝ විට ලැබෙන පිළිතුර නැත යන්නයි. කිසියම් විටෙක හුස්ම ගැනීමේ දී යම් අපහසුතාවයක් ඇති වුව හොත් අපි බෙහෙවින් කලබලයට පත් වන්නෙමු. වෛද්‍යවරුන් වෙත ගොස් ප්‍රතිකාර ලබා ගන්නෙමු. ඇත්ත වශයෙන්ම එය එසේ විය යුතුය. මක් නිසාද යත් අපට හුස්ම නොගෙන ජීවත් විය නොහැකි බැවිනි. අපි අපේ ආහාර රටාව පිළිබඳ සැලකිලිමත් වන්නෙමු. එය ශරීර සෞඛ්‍ය ආරක්ෂා කරගැනීමට ඉවහල් වෙයි. එමෙන්ම අපගේ හුස්ම ගැනීමේ රටාව තුළින් ද නිරෝගී භාවය රැක ගැනීමේ හැකියාව ලැබෙයි. එමගින් ශාරීරික නිරෝගීභාවය මෙන්ම මානසික නිරෝගීභාවය රැක ගැනීමට හැකියාව ලැබෙයි.

ඔබ ආනාපානාසති භාවනාව පුරුදු කරන්නට අදහස් කරන්නෙහි නම් ඒ සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගත යුතුය. බුදුරජාණන් වහන්සේ ඒ සඳහා සුදුසු ස්ථාන තුනක් තිබෙන බව පෙන්වා වදාළහ. 'අරඤ්ඤගතෝවා රුක්ඛමූල ගතෝවා සුඤ්ඤාගාර ගතෝවා...' ආදී වශයෙන් දේශනා කළ පරිදි, ආරණ්‍යයකට යා යුතුය. එනම් ගමෙන් බැහැර, මිනිසුන් නොමැති, විවේකයට සුදුසු ස්ථානයකි. වෘක්ෂමූල නම් එබඳු විවේක සහිත වෘක්ෂ මූලයකි. ශූන්‍යාගාර නම්, පබ්බත කන්දරී, ගිරිගුහා, සුසාන, වනපත්ථ, අබ්භෝකාස, පලාලපුඤ්ජ කියන සත් ආකාර සේනාසනයන්ය. ඒ ඒ සතු අනුවද සුදුසු ස්ථාන තෝරා ගැනීම

කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැගී යන්නෙකු වැනිය

පුළුවන. ග්‍රීෂ්ම සෘතුවේදී වන සේනාසනයද , හේමන්තයෙහි රුක් මුලයද , වැසි සමයෙහි ගුහාගාර ද සුදුසු ස්ථානයන් වේ.

කායානුපස්සනා භාවනාවන් අතුරෙන් පළමු වැනි භාවනාව වශයෙන් දක්වා ඇත්තේ ආනාපානසති භාවනාවයි. මෙම භාවනා ක්‍රමය සියලු බුදුවරයන් වහන්සේලා, පසේ බුදුවරයන් වහන්සේලා , රහතන් වහන්සේලා විසින් අනුගමනය කරන ලද්දකි. මෙය මිනිස් වාසයෙන් තොර , නිසඬ නිස්කලංක පරිසරයකදී කරන්නේ නම් ඉතා සුදුසු වෙයි. ධ්‍යාන ලබාගැනීමට ඝෝෂාකාරී පරිසරය ඉමහත් බාධාවකි. මේ සඳහා ආරණ්‍යය අනුරූප සේනාසනයක් වශයෙන් දක්වා ඇත. සිද්ධාර්ථ බෝසතුන් භාවනා කිරීමට තෝරා ගත්තේ බුද්ධගයාවේ නිසඬ , නිසංසල පරිසරයකි. එද යුගයෙහි එම ප්‍රදේශයේ පරිසරය අදට වඩා වෙනස් විය.

භාවනා කිරීමට සූදානම් වන ඔබ, ඔබගේ අභ්‍යන්තර මෙන්ම බාහිර පවිත්‍රතාවය ගැන ද උනන්දු වීම වැදගත් වෙයි. පළමුකොටම පිරිසිදු සීලයක පිහිටිය යුතුය. අවට පරිසරය , ඇඳුම් පැළඳුම් පිරිසිදු විය යුතුය. ආහාර ගැනීමාදිය නිමා කළ යුතුය. සිත සන්සුන් කර ගත යුතුය. හිතෙහි තරහ සිතිවිලි යටපත් කර ගත යුතුය. කරුණා මෛත්‍රී සිතිවිලි ඇති කර ගත යුතුය. මෙමගින් සිතට ගතට පැහැදිලුවක් දැනෙනු ඇත. පුර්වසේ අසුන් ගත යුතුය. 'නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුං කායං.......' ආදී වශයෙන් වදළ පරිදි, කොඳු ඇට පෙළ එකිනෙක ගැටී සිටින ලෙස උඩු කය සෘජුව තබාගෙන , දෙකලව එකිනෙක බැඳෙන සේ බද්ධ ආසනයෙන් හිඳ ගැනීම සුදුසුය. වාඩි වී සිටින ඉරියව්ව ආනාපානසති භාවනාවට ඉතාම සුදුසුය. පිරිමි පක්ෂයට බද්ධ පර්යංකයත් (එරමිණිය ගොතා) කාන්තාවන් සඳහා අර්ධ පර්යංකයත් සුදුසු වේ. හේත්තු නොවී, කොන්ද සෘජුව තබාගෙන, හිස ද කෙළින් තබාගෙන , දෙනෙත් පියාගෙන භාවනා කිරීම වඩාත් සුදුසු වෙයි.

ආනාපානසති භාවනා ක්‍රමය ඉතා දීර්ඝව පැහැදිලි කළ යුතු භාවනාවකි. එසේ වුවද ඔබගේ පහසුව සඳහා ඉතා සරලව දක්වීමට අදහස් කරමි. ඉහත දක්වන ලද අයුරින් පහසුවෙන් වාඩි වී, ආශ්වාස , ප්‍රශ්වාස වායුව හැපෙන ස්ථාන සිහියෙහි තබා ගන්න. ආශ්වාස කරන කාලය කෙටි විය හැකිය. ඒවා කෙටි ආශ්වාස වශයෙන් සලකන්න. කෙටි ආශ්වාස ප්‍රශ්වාස යම් ප්‍රමාණයක් ගත් විට, තරමක් දිගු ආශ්වාස ප්‍රශ්වාස ගැනීමට සිදුවේවි. ඔබ කළ යුතු වන්නේ , කෙටි ඒවා කෙටි වශයෙනුත්, දිගු ඒවා දිගු වශයෙනුත් දැන ගැනීමයි. ආශ්වාස වායුව හැපෙන ස්ථාන හොඳින් සිහියෙහි තබාගන්න. ඒවායෙහි කෙටි බව සහ දිගු බව නිවැරදි අයුරෙන් සිහි කළ යුතු වෙයි.

දිග හුස්මක් ගත් විට දිග හුස්මක් ගනිමි' යි
දිග හුස්මක් හෙලන විට දිග හුස්මක් හෙලමි' යි
දැනගන්න.

කෙටි හුස්මක් හෙලන විට කෙටි හුස්මක් හෙලමි' යි දැන ගන්න.

මෙසේ සියලු අවස්ථාවලම හුස්ම ගන්න, හුස්ම හෙලන අරමුණෙහිම ඔබේ සිත , සිහිය පවත්වා ගන්න. ගණිතමය ක්‍රමයක් අනුව ඔබට මෙය ඉතා සරල ප්‍රගුණ කර ගැනීමට හැකියාව ඇත. හුස්ම ගැනීමත්, හෙලීමත් එකම කාල පරාසයකට අනුව සිදු නොවේ. ගණන් කිරීම ආරම්භයේ දී හුස්මක් ගන්නා විට එකයි කියන්න. හුස්ම පසත හෙලන විට දෙකයි කියන්න. යළි හුස්ම ගන්නා විට තුනයි යනුවෙනුත් පසත හෙලන විට හතරයි යනුවෙනුත් ගණන් කරන්න. මෙසේ දහය දක්වා හුස්ම ගනිමින් පසත හෙලමින් සිතින් ගණනය කරන්න.



හුස්ම ගැනීම , පසත හෙලීම පිළිබඳ ඔබේ සිත පිහිටුවා ගෙන, දිනින් දිනටම මෙම භාවනාව කිරීමේ දී ඔබේ අවධානය යොමු කළ යුතු තවත් කරුණු ඇත. එනම් ආශ්වාස ප්‍රශ්වාස වායුව හැපෙන්නේ කුමන ස්ථානයේ ද යන කරුණ ගැන දැන ගත යුතුය. ඔබ පසතට හෙලන හුස්ම ඇතැම් විට නාසය අග හැපෙන බව දැනෙනු ඇත. ඇතැම් විට උඩු තොල මුදුනෙහි හැපෙන බව දැනෙනු ඇත. කුමන ස්ථානයක හැපෙන්නේ ද කියා තීරණය කළ යුතු වන්නේ ඔබ විසින්මය. ඉන්පසු හුස්ම ගන්නා විට එම ස්ථානයෙහි හැපෙන විට 'එකයි' යනුවෙන් සිහියේ තබා ගන්න. හුස්ම පසළ හෙලන විට 'දෙකයි' යනුවෙන් සිහි කරන්න. යළි යළිත් මෙම ක්‍රමය අනුගමනය කරන්න. කොපමණ කාලයක් මෙසේ ගණන් කරමින් භාවනා කළ යුතුද? යම් තාක් ගණන් නොකර ආශ්වාස - ප්‍රශ්වාස අරමුණෙහි සිහිය පිහිටයිද? එපමණ කාලයක් මෙම අභ්‍යාසය කළ පසු ඔබ භාවනා නොකළ කාල වකවානුවෙහි බලවත්ව පැවති ආශ්වාස ප්‍රශ්වාස ක්‍රම ක්‍රමයෙන් ඉතා සියුම් තත්ත්වයට පත් වෙයි. ඔබ මෙතෙක් කාලයක් හොඳින් හුස්ම ගෙන තිබේද? ගැඹුරු භාවනාවට යොමු වීමට පෙර අත්හදා බැලීමක් වශයෙන් මෙය කරන්න. ඔබේ දෑත් ඉදිරියට යොමු කර ගෙන දෙතොල යාන්තමින් වසාගෙන හොඳින් හුස්ම ගන්න. පෙනහළු පිරෙන සේ හුස්ම ගන්න. මෙය ඉතා සෙමෙන් කළ යුතුය. ඉහළට ගත් හුස්ම සෙමෙන් පහළට හෙලන්න. මෙය දිනකට තිස් වතාවක් පමණ කර අත්හදා බලන්න. ඔබේ ශරීරයට දැනෙන වෙනස නොබෝ කලකින් අත්විඳිය හැකි වනු ඇත.

මෙම ආනාපානසති භාවනාව වඩන ඔබගේ සිත සන්සුන් බවට පත්වනු ඇත. සිත සන්සුන් වන නිසා ඔබ ඉගෙන ගන්නා අයකු නම් එම කටයුතුවලට පහසුවක් වනු ඇත. ඔබේ ධාරණ ශක්තිය දියුණු වනු ඇත. ලෙඩ රෝග බොහොමයක් සමනය කර ගත හැකිවනු ඇත. විශේෂයෙන් අධි රුධිර පීඩනය , හෘදයාබාධ වළක්වා ගැනීමටත් සුව කර ගැනීමටත් මෙය උපකාරී වෙයි. ජීවිතයෙහි එදිනෙදා කටයුතු පහසුවෙන් කර ගැනීමට හැකියාව ලැබෙයි.

එසේම මෙම භාවනාව වඩන පිංවතාට හෝ පිංවතියට ආශ්වාස ප්‍රශ්වාස ගණන් කිරීමෙන් ද , ඒ අනුව සිහිය පවත්වා ගැනීමෙන් ද අග - මුල මැද වශයෙන් වායුව හැපෙන ස්ථානයන්හි සිහිය පිහිටුවා ගැනීමෙන් ද හුස්ම ගැනීම , හෙළීම පිළිබඳ මැනවින් සිහිය පිහිටුවා ගැනීමෙන් ද, සිත් සන්සිඳුවා ගත හැකි වනු ඇත. ක්ලේශයන් සමනය කර ගත හැකි වනු ඇත. මෙසේ දීර්ඝ වශයෙන් ආනාපානසති භාවනාව වඩන විට ඔබගේ නීවරණ යටපත් වන්නේය. සෙසේ සන්සිඳෙන්නේය. සිහිය පිහිටන්නේය. සිත උපචාර සමාධියෙන් යුක්ත වන්නේය. එසේ හෙයින්

"ආනාපාන සතියස්ස -
පරිපුණ්ණා සුභාවිතා
අනුපුබ්බා පරිචිතා -
යථා බුද්ධෙන දේසිතා"
"සෝ ඉමං
ලෝකං පභාසේති -
අබ්භාමුත්තොව චන්දිමා"

යමකු විසින් බුදුරදුන් වදළ ආනාපානසතිය සම්පූර්ණයෙන් භාවිතා කරනු ලබන්නේද, පිළිවෙළින් පුරුදු පුහුණු කරන්නේද හෙතෙම වලා ගැබෙන් මිදුන පුන් සඳ මෙන් ලෝකය ආලෝකමත් කරන්නේය. (විසුද්ධි මාර්ගය)

ධර්මවේදී නාලන්දේ විමලවංශ හිමි

ලොකෙකනාථ වදනම්බුජ රාජහංසං
වෙනෙයය කොමුදවනං කිර ජොතයනතං
සෙට්ඨං මහග්ඝ වරරූප විරාජමානං
වන්දාමි වාමමමලං ජිනදනත ධාතුං

(දන්ත ධාතූන් වහන්සේ වඳින ගාථාව)



පින් සිතින් මුද්‍රණ දායකත්වය
**ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම**

බුදු සරණ | Daily News | සිළුමිණ | දිනමිණ | SUNDAY OBSERVER
தினகரன் | தினகரன் | තරුණී | සරසවිය | සුබසෙත
නවයුගය | ක්‍රීඩා | මිහිර

මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ තුමා විසින් ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ (ලේක් හවුස්) මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.